# (ඇ) රාජ්‍ය ව්‍යවසායයන්

පසුගිය වසර කිහිපය තුළ මූල්‍ය අතින් බලන කළ පවත්වාගෙන යා නොහැකි තරම් තත්වයක තිබුණ රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් කීපයක්ම මෑතකදී පටන් ලාභ පෙන්වීමට සමත් වී ඇත. රාජ්‍ය ව්‍යවසාය අංශය එකට ගත් කළ එම අංශය රටේ ආර්ථික සංවර්ධනය උදෙසා පුරෝගාමී ලෙස කටයුතු කළයුතු යයි දැනටඅපේක්ෂා කෙරේ. දැනට මෙම අංශයෙහි කාර්මික නිෂ්පාදන කටයුතුවල නියුතු ප්‍රධාන පෙලේ සංස්ථාවන් 24 ක්ද, බැංකු, වෙළඳ හා ප්‍රවාහන යනාදි නොයෙකුත් සේවා කටයුතුවල යෙදෙන සංස්ථා 31 ක් ද ඇත. 1970 වර්ෂය සඳහා වන තාවකාලික සංඛ්‍යා ලේඛන අනුව කාර්මික හා සේවා සංස්ථාවන්හි සම්පූර්ණ නිෂ්පාදිත හා සේවා වටිනාකම 1970 දී රුපියල් දශලක්ෂ 1,940 ක්[1] වූ අතර, ඊට කලින් වර්ෂයේදි එය රුපියල් දශලක්ෂ 1,732[1] ක් විය. කාර්මික සංස්ථා 24 හි පමණක් මුළු නිෂ්පාදන වටිනාකම 1970 වර්ෂය සඳහා රුපියල් දශලක්ෂ 583 ක් වූ අතර, 1969 දී රුපියල් දශලක්ෂ 424 ක් විය. රජයේ දෙපාර්තමේන්තු හැරුණු විට රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය 1968/69 වර්ෂය තුළ 145,544 දෙනාගේ සිට 1969/70 දී 158,399 දෙනා දක්වා සියයට 9 කින් වැඩිවී ඇති බැව් පෙනේ.

1969 දී රාජ්‍ය කාර්මික සංස්ථා කීපයක්ම විශේෂයෙන් සිමෙන්ති, ටයර්, ලුණු, ඉල්මනයිට්, පදම්කළ හම් හා රෙදි නිෂ්පාදනයන්හි යෙදෙන සංස්ථා තම නිෂ්පාදනයන්හි වැඩිවීමක් පෙන්වා ඇත. එහෙත්, තේ පෙට්ටි, සීනි, රවුම් වානේ, ක්‍රෝම් හම් සහ උදළු නිෂ්පාදනය පහළ බැස ඇත, එසේ වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කම්කරු ආරාවුල්, වෙළඳ දුෂ්කරතාවයන් හා සෑහෙන තරම් අමු ද්‍රව්‍ය නොලැබීම විය හැක. 1970 මුල් භාගය සඳහා වන නිෂ්පාදන සංඛ්‍යා ලේඛන, කලින් අවුරුද්දේ එම කාලය සඳහා වන සංඛ්‍යා ලේඛන හා සසඳා බලන විට, රෙදි, සීනි, කඩදාසි, රසායන ද්‍රව, හම් හා ටයර් යන මේවායේ නිමැවුමෙහි දියුණුවක් සිදුවී ඇති බැව් පෙනේ. එසේ වුවත්, 1969/70 වර්ෂය තුළ මූල්‍ය සම්පාදනය බලාපොරොත්තු වූ ඉලක්ක වලින් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත. සාමාන්‍ය වශයෙන් බලන කල මෙයටද හේතු වන්නට ඇත්තේ කම්කරු ආරාවුල්, අවාසි, සහගත කාලගුණය සහ අවශ්‍ය තරම් අමු ද්‍රව්‍ය නොලැබීම විය හැක.

1969/70 වර්ෂයේදී බැංකු සහ මූල්‍ය ආයතන ඇතුළුව සංස්ථා 26 ක් ලාභ පෙන්වා ඇත. මෙයින් 10 ක් පසුගිය වර්ෂයට වඩා විශාල වශයෙන් වැඩි ලාභ පෙන්වා ඇති අතර, 9 ක් ඉකුත් වර්ෂයට වඩා අඩු ලාභද, 1 ක් ඉකුත් වර්ෂයේ ලැබූ අලාභයන් වෙනුවට ලාභයක්ද ලබා ඇත. සංස්ථා 12 ක් සහ ලංකා දුම්රිය සේවය 1969/70 වර්ෂය තුළ අලාභ ලබා ඇති අතර, මින් 6 ක් ඉකුත් වර්ෂයට වඩා වැඩි අලාභ ලබා ඇත. එක සංස්ථාවක් අලාභ අඩු කරගෙන ඇති අතර, 6 ක් ඉකුත් වර්ෂයේ ලැබූ ලාභ වෙනුවට මෙවර අලාභ ලබා ඇත. සංස්ථා 6 ක් සඳහා 1969/70 වර්ෂයේ ලාභ අලාභ සංඛ්‍යා ලැබී නොමැති අතර, ඉකුත් වර්ෂයේ මින් 3 ක් ලාභද, ඉතිරි සංස්ථා 3 අලාභ ද ලබා ඇත,

යම් පොදු ව්‍යවසායක ක්‍රියාකාරිත්වය අගය කිරීමේදී එහි ලාභ හෝ අලාභ සාමාන්‍ය වශයෙන් මිණුම් දණ්ඩ කරගත යුතුය. එහෙත් රාජ්‍ය ව්‍යාවසායයන්, පෞද්ගලික ව්‍යාපාර මගින් සිදු නොකරන, සාපේක්ෂ වශයෙන් ලාභ සහිත නොවන සේවාවන් සිදුකරන නිසාත්, මිල නියම කිරීමට සම්පූර්ණ නිදහසක් නැති නිසාත්, මෙම මිනුම් දණ්ඩ එතරම් බැරෑරුම් ලෙස යොදගත යුතු නොවේ

සමහර කොටස්වලට අයත් පරිභෝගිකයන් හට සහන සැලසීම කාර්මික සංස්ථා වන්ට සිදුවන බැවින්, එවැනි සංස්ථාවන් එම සහනවලට යටත්වන තම කටයුතු වෙළඳ කටයුතුවලින් වෙන්කොට දක්වන්නේ නම්, එම සංස්ථාවලට අයුතු විවේචන වලින් වැලකී සිටීමට හැකිවනු ඇත.

---

1. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සහ රාජ්‍ය වැවිලි සංස්ථාවේ සේවාවන්හි වටිනාකම් පිළිබඳ තොරතුරු නොලැබුණ හෙයින් එම වටිනාකම් මෙයට අඩංගු නොවේ.

පූර්ණ වශයෙන් ගත් කළ, 1969/70 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවන් බොහොමයක්ම පෙන්නා ඇති දියුණුවට හේතුවී ඇත්තේ තම ධාරිතාව වඩා හොඳින් උපයෝගී කර ගැනීමත්, ඇත්තාවූ ධාරිතාව පුළුල් වීමත් හා වඩා හොඳ ක්‍රම සම්පාදනයත් විය හැක.

බොහෝ සංස්ථාවන්හි ගණන් පිළියෙල කිරීමේ ක්‍රම ඒකාකාර නොවන බැවින්, භාණ්ඩාගාරය යටතේ ඇති රාජ්‍ය සංස්ථා අංශය 1969 අප්‍රේල් මාසයේ ගණන් පිළිබඳ කටයුතු පිළියෙල කිරීමේදී පිළිපැදිය යුතු ආකාරය ගැන උපදෙස් සංස්ථාවන්ට නිකුත් කොට ඇත. අයවැය සකස්කිරීම ගැනද, 1970 ජූනි මාසයේදී එවැනිම උපදෙස් නිකුත් කෙරින. ක්‍රම සම්පාදන සහ රැකී රක්ෂා පිළිබඳ අමාත්‍යාංශයද යෝජනා ක්‍රම පිළිබඳ පුළුල් වාර්තා සැපයීම ගැන සංස්ථාවන්ට උපදෙස් නිකුත් කොට ඇත. මෙවැනි පියවර නිසා රාජ්‍ය සංස්ථාවන්හි ගණන් පිළියෙලකිරීම, අයවැය හා යෝජනා ක්‍රම සම්පාදන යේදී සෑහෙන තරම් දුරට දියුණු වෙතැයි බලාපොරොත්තු වේ.

තම වාර්ෂික වාර්තා සහ ගණන් වාර්තා නිකුත්කිරීමේ ප්‍රමාදයෙන් කලට වේලාවට අවශ්‍ය තොරතුරු ලබාගත නොහැකිවිය. එම නිසා තම මුදල් වර්ෂ අවසාන වූ විගස මෙම වාර්තා නිකුත් කිරීමට සංස්ථා සෑම උත්සාහයක්ම ගැනීම ඉතා වැදගත්ය.

මතු දැක්වෙන ඡේදයන්හි හා සංඛ්‍යා සටහන්වල ප්‍රකාශයට පත්කොට ඇති සංඛ්‍යා ලේඛන ඒ ඒ සංස්ථාවන් විසින් සපයන ලද සංඛ්‍යා තොරතුරු පදනම් කරගත් ඒවාය. 1966/67 සහ 1967/68 යන වර්ෂයන් සඳහා සමහර සංස්ථාවන්හි ලාභ සහ අලාභ පිළිබඳ සංඛ්‍යා සටහන් ඕඩිටර් ජනරාල්ගේ වාර්තා ආශ්‍රයෙන් නැවතත් සකස් කරන ලදී.

## (අ) කර්මාන්ත අංශය

1970 වර්ෂයේ නිෂ්පාදන කටයුතුවල නිරත වූ කාර්මික සංස්ථා සහ මණ්ඩල 24 ක් විය. මෙම සංස්ථා කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි සංස්ථාවන් විසින්ම පිළියෙල කරගත් ඉලක්කයට අනුකූලව කටයුතු කරගෙන යන ලදී. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ පළතුරු ඇසුරුම් කම්හල සහ සුරාබද්ධ දෙපාර්තමේන්තුවේ රජයේ ස්කාගාරය ද රජයේ දෙපාර්තමේන්තු වශයෙන් කටයුතු කරන ලදී. මෙම අංශයේ මුළු ප්‍රාග්ධන ආයෝජන 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 952·9 ක් වූ අතර, මෙය රුපියල් දශලක්ෂ 394·9 කින් නොහොත් සියයට 41 කින් වැඩිවී, 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 1347·8 ක් විය.

1969/70 වර්ෂයේ කර්මාන්තවල යෙදුනු පොදු අංශයේ ව්‍යවසායවල මුළු නිෂ්පාදන වටිනාකම් රුපියල් දශලක්ෂ 159·1 කින් නොහොත් සියයට 38 කින් වැඩිවිය. 1969/70 වර්ෂයේ මේ අංශයේ සේවා නියුක්තිය 24508 දක්වා 2104 කින් වැඩිවිය.

1969/70 වර්ෂයේදී ශ්‍රී ලංකා සීනි සංස්ථාව, රාජ්‍ය පිටි නිෂ්පාදන සංස්ථාව, ජාතික ලුණු සංස්ථාව, ජාතික පේෂකර්ම සංස්ථාව, පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාව, ලංකා සිමෙන්ති සංස්ථාව සහ ලංකා ඛණිජ වැලි සංස්ථාව තම ලාභ වැඩිකර ගන්නා ලද අතර, නැගෙනහිර කඩදාසි සංස්ථාව, ලංකා තුනී ලෑලි සංස්ථාව, ලංකා ටයර් සංස්ථාව, ලංකා පොහොර සංස්ථාව, ලංකා පිඟන් බඩු සංස්ථාව සහ ලංකා වානේ සංස්ථාව පසුගිය වර්ෂයට වඩා අඩු, එහෙත් ප්‍රමාණවත් ලාභ ලැබීමට සමත්වී ඇත. ලංකා කිරි මණ්ඩලය, ජාතික සුළු කර්මාන්ත සංස්ථාව සහ රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව පසුගිය වර්ෂ කිහිපය තුළම වර්තන අලාභ ලබා ඇත. ලංකා තෙල් හා මේද සංස්ථාව සහ ලංකා සම් භාණ්ඩ සංස්ථාව පෙර වර්ෂවල ලාභ ලැබූ අතර, 1969/70 වර්ෂයේ අලාභ පෙන්වා ඇත. රාජ්‍ය කාර්මික ව්‍යවසායයන්හි ප්‍රාග්ධන ඵලද පිළිබඳ සංඛ්‍යා II (ආ) සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## රාජ්‍ය කාර්මික සංස්ථාවන්ගේ වාර්ෂික ධාරිතාව, නිෂ්පාදනය සහ

| සංස්ථාව1 | නිෂ්පාදන ඒකක | 1966/67 | | | 1967/68 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් |
| 1· ජාතික කිරි මණ්ඩලය | | | | | | | |
| (අ) සකස් කළ කිරි .. | පයින්ට් '000 | 59,250 | 18,566 | 17,203 | 59,250 | 20,382 | 19,526 |
| (ආ) උකු කිරි .. | ටින් '000 | — | — | — | — | — | — |
| (ඇ) පිටි කිරි .. | රා: 1 ටින් '000 | — | — | — | — | — | — |
| 2· ලංකා තෙල් සහ මේද | | | | | | | |
| (අ) පොල් තෙල් .. | ටොන් | 22,320 | 1,759 | 2,207 | 22,320 | 1,300 | 1,293 |
| (ආ) සත්වාහාර .. | ,, | 31,200 | 29,234 | 29,144 | 31,200 | 30,011 | 30,383 |
| (ඇ) මේද අම්ල .. | ,, | — | — | — | 5,400 | 350 | 220 |
| (ඇ) ග්ලිසරින් .. | ,, | — | — | — | 5,400 | 22 | — |
| (ඉ) වෙනත් තෙල් .. | ,, | — | — | — | — | — | — |
| 3· ශ්‍රී ලංකා සීනි | | | | | | | |
| (අ) කන්තලේ ඒකකය | | | | | | | |
| i. සීනි .. | මෙට්. ටොන් | 21,000 | 2,587 | 2,587 | 21,000 | 1,403 | 1,403 |
| ii. ස්ප්‍රීතු .. | ප්‍රෑෆ් ගැ. '000 | 600 | 871 | 832 | 600 | 426 | 503 |
| (ආ) ගල්ඔය ඒකකය | | | | | | | |
| i. සීනි .. | මෙට්. ටොන් | 19,200 | 915 | 2,539 | 19,200 | 5,789 | 5,789 |
| ii. ස්ප්‍රීතු .. | ප්‍රෑෆ් ගැ. '000 | 750 | 249 | 282 | 750 | 300 | 300 |
| 4· රාජ්‍ය පිටි නිෂ්පාදන | | | | | | | |
| (අ) පිටි .. | ටොන් | — | — | — | — | — | — |
| (ආ) අතුරු නිෂ්පාදන .. | ,, | — | — | — | — | — | — |
| 5· ජාතික ලුණු | | | | | | | |
| (අ) සංස්ථාවේ ලුණු ලේවා · | ටොන් | 57,690 | 51,864 | }60,800 | 60,800 | 62,839 | }77,546 |
| (ආ) පුද්ගලික ලුණු ලේවා .. | ,, | 16,645 | 14,387 | | 12,050 | 16,327 | |
| 6· අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව පළතුරු ඇසුරුම් කම්හල | | | | | | | |
| (අ) ජෑම් .. | රාත්. '000 | ල· නො· | 1,208 | 1,208 | ල· නො· | 1,384 | 1,384 |
| (ආ) යුෂ වර්ග .. | ,, | ල· නො· | 248 | 248 | ල· නො· | 208 | 208 |
| (ඇ) ක්‍රීම් වර්ග .. | ,, | ල· නො· | 18 | 18 | ල· නො· | 11 | 11 |
| (ඇ) වෙනත් නිෂ්පාදන .. | ,, | ල· නො· | 529 | 529 | ල· නො· | 588 | 588 |
| 7· රජයේ ස්කාගාරය | | | | | | | |
| (අ) සාමාන්‍ය අරක්කු .. | ප්‍රෑෆ් ගැලුම් | ල· නො· | 90,333 | — | ල· නො· | 126,131 | 77,031 |
| (ආ) දෙවරක් පෙරූ · | ,, | ල· නො· | 10,330 | — | ල· නො· | 4,197 | 11,097 |
| 8· ජාතික පේෂකර්ම | | | | | | | |
| (අ) වේයන්ගොඩ කම්හල | | | | | | | |
| i. නූල් .. | රාත්. '000 | 3,400 | 2,345 | 2,270 | 3,400 | 1,958 | 1,000 |
| ii. රෙදිපිළි .. | යාර '000 | 14,000 | 2,782 | 1,924 | 14,000 | 4,584 | 5,431 |
| iii. නිමහම් .. | යාර '000 | — | 6,009 | — | — | 6,639 | — |
| (ආ) නූල් ආනයන .. | රාත්. '000 | — | 8,316 | 6,477 | — | 9,849 | 8,823 |
| 9· ලංකා සම්භාණ්ඩ | | | | | | | |
| (අ) සපත්තු .. | කුට්ටම් '00 | 216 | 246 | 244 | 216 | 260 | 255 |
| (ආ) ක්‍රෝම් .. | වර්ග අඩි '000 | 600 | 649 | 118 | 600 | 629 | 145 |
| (ඇ) බාක් සහ අනිකුත් සම් .. | රාත්. '000 | 300 | 289 | 22 | 300 | 334 | 26 |
| (ඇ) විවිධ භාණ්ඩ .. | සංඛ්‍යාව '000 | — | — | — | — | — | — |
| 10· නැගෙනහිර කඩදාසි කර්මාන්ත | | | | | | | |
| (අ) නිපදවීම් කඩදාසි .. | ටොන් | 8,500 | 9,156 | 6,684 | 9,000 | 9,500 | 6,014 |
| (ආ) වෙළඳ කඩදාසි ආනයන· | ටොන් | — | 12,600 | 7,644 | — | 6,700 | 7,155 |
| 11· ලංකා තුනී ලෑලි | පතුරු තුනේ වර්ග අඩි '000 | 18,000 | 19,649 | — | 25,000 | 19,806 | — |
| | ඉන්; තේ පෙට්ටි '000 | 1,200 | 855 | 846 | 1,300 | 854 | 846 |
| 12· රාජ්‍ය දැව | | | | | | | |
| (අ) දැව .. | ඝන අඩි '000 | — | — | — | — | — | — |
| 13· පරන්තන් රසායන ද්‍රව්‍ය | | | | | | | |
| (අ) කෝස්ටික් සෝඩා .. | ටොන් | 1,500 | 1,002 | 1,002 | 1,500 | 970 | 970 |
| (ආ) ක්ලෝරින් .. | ,, | 1,400 | 397 | 397 | 1,400 | 540 | 540 |
| (ඇ) මේස ලුණු .. | ,, | 100 | 89 | 89 | 100 | 121 | 121 |
| (ඇ) ආනයන කෝස්ටික් සෝඩා | ,, | — | 3,400 | 1,400 | — | 3,000 | 2,333 |

1· සියළුම ස)ඛ්‍යා ඒ ඒ සංස්ථාවන්ගේ මුදල් වර්ෂය සඳහාය. (ජාතික කිරි මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තෙල් පිරිපහදුව සහ තෙල් මුහු කම්හල සඳහා සංඛ්‍යා ජනවාරි සිට දෙසැම්බර් දක්වා වන අතර, අනෙක් සංස්ථා අප්‍රේල් සිට මාර්තු දක්වා වේ.) රජයේ ස්කාගාරය සහ අලෙවි කිරීමේ පළතුරු ඇසුරුම් කම්හල සඳහා මුදල් වර්ෂය ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වාය.

| 1968/69 | | | 1969/70 | | | 1970/71 | | |
|---|---|---|---|---|---|---|---|---|
| ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් |
| 59,250 | 24,968 | 23,084 | 59,250 | 28,302 | 26,292 | 59,250 | 32,105 | 32,709 |
| 25,000 | 11,514 | 6,011 | 25,000 | 19,632 | 19,333 | 25,000 | 14,676 | 15,047 |
| — | — | — | 12,000 | 8,351 | 2,281 | 12,000 | 11,921 | 11,279 |
| 22,320 | 1,166 | 1,184 | 22,320 | 1,226 | 307 | 22,320 | 3,474 | 3,474 |
| 31,200 | 51,524 | 54,061 | 31,200 | 51,017 | 50,868 | 31,200 | 58,375 | 58,375 |
| 5,400 | 6,286 | 1,319 | 5,400 | 694 | 877 | 5,400 | 2,672 | 2,672 |
| 5,400 | 549 | 133 | 5,400 | 73 | 149 | 5,400 | 268 | 268 |
| ල· නො· | 88 | 24 | ල· නො· | — | — | ල· නො· | — | — |
| 21,000 | 3,653 | 3,653 | 21,000 | 5,478 | 5,478 | 21,000 | 8,000 | 8,000 |
| 600 | 832 | 795 | 600 | 768 | 770 | 600 | 800 | 750 |
| 19,200 | 4,684 | 4,684 | 19,200 | 3,719 | 3,719 | 19,200 | 5,400 | 5,400 |
| 750 | 473 | 317 | 750 | 673 | 636 | 750 | 800 | 700 |
| ල· නො· | 6,649 | 9,274 | 49,200 | 41,428 | 42,181 | 51,554 | 51,554 | 51,554 |
| ල· නො· | 4,382 | 5,420 | 20,300 | 15,563 | ල· නො· | 19,966 | 19,966 | 19,966 |
| 71,900 | 81,417 | } 79,382 | 69,500 | 88,732 | } 82,922 | 70,000 | 53,176 | } 85,000 |
| 13,600 | 18,515 | | 17,650 | 23,094 | | 21,000 | 10,277 | |
| ල· නො· | 1,179 | 1,179 | ල· නො· | 2,291 | 2,291 | ල· නො· | 1,846 | 1,846 |
| ල· නො· | 153 | 153 | ල· නො· | 357 | 357 | ල· නො· | 455 | 455 |
| ල· නො· | 125 | 125 | ල· නො· | 105 | 105 | ල· නො· | 165 | 165 |
| ල· නො· | 312 | 312 | ල· නො· | 562 | 562 | ල· නො· | 342 | 342 |
| ල· නො· | 92,711 | 135,926 | ල· නො· | 92,074 | 91,781 | ල· නො· | 150,073 | 141,194 |
| ල· නො· | 9,510 | 4,197 | ල· නො· | 8,147 | 14,487 | ල· නො· | 16,101 | 16,101 |
| 3,400 | 2,397 | 489 | 3,400 | 2,644 | 972 | 20,600* | 3,200 | 579 |
| 14,000 | 6,423 | 5,028 | 14,000 | 8,664 | 8,448 | 27,100 | 12,090 | 12,090 |
| — | 7,640 | — | 34,000 | 1,987 | — | 74,000 | 8,000 | — |
| — | 11,600 | 10,500 | — | 7,273 | 8,900 | — | — | — |
| 271 | 275 | 253 | 350 | 281 | 229 | 350 | 350 | 350 |
| 600 | 667 | 125 | 720 | 688 | 145 | 720 | 720 | 158 |
| 300 | 364 | ල· නො· | 420 | 358 | 11 | 420 | 420 | 49 |
| — | 321 | ල· නො· | — | ල· නො· | — | — | ල· නො· | — |
| 9,000 | 7,968 | 10,045 | 9,500 | 9,475 | 8,469 | 9,500 | 9,500 | 8,470 |
| — | 6,491 | 6,890 | — | 5,684 | 4,757 | — | 5,380 | 9,054 |
| 30,000 | 22,507 | — | 30,000 | 20,242 | — | 30,000 | 24,435 | — |
| 1,300 | 1,103 | 1,077 | 1,300 | 802 | 781 | 1,300 | 1,105 | 1,105 |
| ල· නො· | 1,138 | 1,138 | ල· නො· | ල· නො· | ල· නො· | ල· නො· | ල· නො· | ල· නො· |
| 1,500 | 930 | 908 | 1,500 | 897 | 958 | 1,500 | 1,400 | 1,400 |
| 1,400 | 518 | 477 | 1,300 | 505 | 454 | 1,300 | 500 | 500 |
| 100 | 231 | 215 | 400 | 289 | 278 | 400 | 400 | 400 |
| — | 2,300 | 2,639 | — | 2,612 | 2,568 | — | 2,800 | 2,800 |

2· පළතුරු කෑලි, ලෙලි, ජෙලි, සෝස් වර්ග සහ සුප් ඇතුළත්ය.
3· අවසාන වර්ෂ දෙක සඳහා සංඛ්‍යා ජනවාරි සිට දෙසැම්බර් දක්වා වේ.
* තුල්හිරිය කම්හලෙහි ධාරිතාව ඇතුළත්ය.

## රාජ්‍ය කාර්මික සංස්ථාවන්ගේ වාර්ෂික ධාරිතාව, නිෂ්පාදනය සහ

| සංස්ථාව[1] | නිෂ්පාදන ඒකක | 1966/67 | | | 1967/68 | | |
|---|---|---|---|---|---|---|---|
| | | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් |
| **14.** ලංකා ටයර් | | | | | | | |
| (අ) ටයර් .. | සංඛ්‍යාව | — | — | — | 250 000 | 57,622 | 28,284 |
| (ආ) ටියුබ් .. | ,, | — | — | — | 152,000 | 62,062 | 33,063 |
| (ඇ) පතු .. | ,, | — | — | — | 88,000 | 29,477 | 17,873 |
| **15.** ලංකා ඛනිජ තෙල් නීතිගත | | | | | | | |
| (අ) තෙල් පිරිපහදුව | | | | | | | |
| i. ගැසලින් .. | ගැලුම් '000 | — | — | — | — | — | — |
| ii. භූමිතෙල් .. | ,, | — | — | — | — | — | — |
| iii. රසායනික නැප්තා .. | ,, | — | — | — | — | — | — |
| iv. ඩීසල් .. | ,, | — | — | — | — | — | — |
| v. ඉන්ධන තෙල් .. | ,, | — | — | — | — | — | — |
| vi. ඇස්පෝල්ට් .. | ,, | — | — | — | — | — | — |
| vii. වෙනත් නිෂ්පාදන .. | ,, | — | — | — | — | — | — |
| (ආ) ලිහිස්සි තෙල් කම්හල .. | ,, | — | — | — | — | — | — |
| i. ලිහිස්සි තෙල් .. | ,, | — | — | — | — | — | — |
| **16.** ලංකා පෝර | | | | | | | |
| (අ) පෝර .. | ටොන් | — | 127,100[2] | 123,968 | — | 170,377[2] | 161,971 |
| **17.** ලංකා පිඟන් භාණ්ඩ | | | | | | | |
| (අ) මීගමුව කම්හල .. | පිඟන් කෝප්ප ටොන් | 880 | 815 | ල. නො. | 940 | 954 | ල. නො. |
| (ආ) පිළියන්දල කම්හල .. | පිඟන් කෝප්ප ටොන් | 1,600 | 189 | — | 1,600 | 1,180 | ල. නො. |
| | පිඟන් ගඩොල් ටොන් | — | — | — | 300 | 125 | ල. නො. |
| | පවිත්‍රතා උප-කරණ ටොන් | — | — | — | 500 | 110 | ල. නො. |
| (ඇ) පිඟන් මැටි පිරිපහදුව .. | පිඟන් මැටි ටොන් | 5,000 | 2,027 | 1,916 | 5,000 | 2,658 | 2,181 |
| **18.** ලංකා සිමෙන්ති | | | | | | | |
| (අ) කන්කසන්තුරේ .. | ටොන් | 120,000 | 86,729 | 86,492 | 165,000 | 160,491 | 164,981 |
| (ආ) ගාල්ල .. | ,, | — | — | — | 100,000 | 46,140 | 49,718 |
| (ඇ) පුත්තලම .. | ,, | — | — | — | — | — | — |
| **19.** ජාතික යුළු කර්මාන්ත | | | | | | | |
| (අ) ගඩොල් සහ .. | සංඛ්‍යාව '000 | 21,264 | 10,620 | 11,121 | 21,264 | 11,347 | 11,059 |
| (ආ) ධීවර යාන්ත්‍රාංගණය .. | ,, | ල. නො | 30 | 31 | ල. නො. | 17 | 22 |
| **20.** ලංකා ඛනිජ වැලි | | | | | | | |
| (අ) ඉල්මනයිට් .. | ටොන් | 90,000 | 45,234 | 40,360 | 90,000 | 64,328 | 55,350 |
| (ආ) රූටයිල් .. | ,, | — | — | — | — | — | — |
| (ඇ) සර්කොන් .. | ,, | — | — | — | — | — | — |
| **21.** ලංකා වානේ | | | | | | | |
| (අ) රෝල් නිෂ්පාදන .. | මෙට්. ටොන් | — | — | — | 60,000 | 25,425 | 24,407 |
| (ආ) කම්බි නිෂ්පාදන .. | ,, | — | — | — | 12,000 | 3,343 | 3,007 |
| **22.** රාජ්‍ය ලෝහ භාණ්ඩ | | | | | | | |
| (අ) ලෝහ භාණ්ඩ කම්හල . | ඒකක '000 | 3,400 | 449 | 427 | 3,400 | 1,456 | 920 |
| (ආ) යකඩ වාත්තු කම්හල වාත්තු කිරීම .. | ටොන් | — | — | — | — | — | — |
| **23.** ලංකා ධීවර[3] | | | | | | | |
| (අ) ඇල්ලූ මසුන් .. | රාත්. '000 | — | 5,980 | 7,178 | — | 6,663 | 6,711 |
| (ආ) මිලදී ගත් මසුන් .. | ,, | — | 2,487 | — | — | 3,134 | — |
| (ඇ) ටින්වල ඇහිරීමේ කර්මාන්ත ශාලාව .. | ටින් '000 | — | — | — | — | — | — |
| (ඈ) බෝට්ටු යාන්ත්‍රාංගනය . | සංඛ්‍යාව | — | — | — | — | 1 | 1 |
| (ඉ) අතුරු නිෂ්පාදිත .. | | | | | | | |
| i. සැකසූ මාළු .. | රාත්. '000 | — | 345 | 333 | — | 378 | 366 |
| ii. මත්ස්‍ය ආහාර .. | ,, | — | 104 | 98 | — | 85 | 85 |
| iii. මෝර තෙල් .. | ,, | — | 23 | 28 | — | 23 | 31 |
| iv. මෝර වරල් .. | | — | 4 | — | — | 5 | — |
| v. අයිස් .. | | — | — | — | — | — | — |

## විකුණුම් ප්‍රමාණයන්-1966/67 සිට 1970/71 — II (ඇ) 1 සංඛ්‍යා සටහන (සම්බන්ධය)

| 1968/69 | | | 1969/70 | | | 1970/71 | | |
|---|---|---|---|---|---|---|---|---|
| ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් | ධාරිතාව | නිෂ්පාදනය | විකුණුම් |
| 250,000 | 58,553 | 58,553 | 250,000 | 71,403 | 59,395 | 250,000 | 151,000 | 130,150 |
| 152,000 | 40,456 | 40,456 | 152,000 | 38,946 | 51,780 | 152,000 | 130,000 | 114,115 |
| 88,000 | 4,328 | 4,328 | 88,000 | 25,297 | 26,846 | 88,000 | 44,000 | 33,950 |
| ල. නො. | 13,368 | 13,368 | ල. නො. | 42,184 | 42,184 | ල. නො. | 47,574 | 47,574 |
| ල. නො. | 17,194 | 16,681 | ල. නො. | 74,757 | 74,757 | ල. නො. | 78,680 | 78,680 |
| ල. නො. | — | — | ල. නො. | 28,316 | 28,316 | ල. නො. | 36,525 | 36,525 |
| ල. නො. | 27,365 | 26,683 | ල. නො. | 110,514 | 110,514 | ල. නො. | 114,942 | 114,942 |
| ල. නො. | — | 47,172 | ල. නො. | 162,074 | 162,074 | ල. නො. | 132,843 | 132,843 |
| ල. නො. | 48,123 | 701 | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. |
| ල. නො. | 1,397 | ල. නො. | ල. නො. | 6,611 | 6,611 | ල. නො. | 8,720 | 8,720 |
| — | — | — | 4,032 | 3,843 | 3,843 | 4,032 | 3,642 | 3,642 |
| — | 237,945[2] | 173,069 | — | 157,288[2] | 186,433 | — | 259,000[2] | 259,000 |
| 940 | 1,004 | 1,045 | 940 | 918 | 935 | 940 | 840 | 840 |
| 1,600 | 1,338 | 1,335 | 1,600 | 1,032 | 1,040 | 1,600 | 1,200 | 1,200 |
| 300 | 184 | 181 | 300 | 453 | 478 | 300 | 500 | 500 |
| 500 | 345 | 211 | 500 | 453 | 199 | 500 | 500 | 340 |
| 5,000 | 2,900 | 2,824 | 5,000 | 3,233 | 3,045 | 5,000 | 3,600 | 3,600 |
| 175,000 | 158,367 | 146,488 | 185,000 | 188,221 | 196,153 | 200,000 | 200,000 | 200,000 |
| 100,000 | 88,265 | 82,859 | 100,000 | 80,115 | 85,536 | 100,000 | 100,000 | 100,000 |
| — | — | — | — | — | — | 220,000 | 147,500 | 143,180 |
| 19,226 | 11,797 | 10,998 | 21,380 | 11,616 | 11,610 | 21,280 | 15,280 | 15,280 |
| — | — | 9 | — | — | — | — | — | — |
| 90,000 | 75,986 | 73,430 | 90,000 | 77,356 | 81,482 | 91,000 | 91,000 | 80,000 |
| 10,800 | 1,967 | 2 | 10,800 | 1,549 | 2,830 | 10,800 | 3,000 | 3,000 |
| 9,500 | — | — | 9,500 | — | — | 9,500 | 600 | — |
| 60,000 | 25,582 | 18,284 | 60,000 | 20,689 | 24,810 | 60,000 | 36,800 | 34,850 |
| 12,000 | 4,930 | 3,518 | 12,000 | 4,925 | 5,719 | 12,000 | 9,625 | 9,625 |
| 3,400 | 1,205 | 847 | 3,400 | 1,106 | 1,182 | 12,000 | 1,524 | 2,115 |
| — | — | — | — | — | — | 6,000 | 2,678 | 2,287 |
| — | 9,976 | 6,717 | — | 8,076 | 4,899 | — | 13,858 | 14,602 |
| — | 1,808 | — | — | 1,473 | — | — | 4,197 | — |
| 933 | 65 | ල. නො. | — | 150 | — | — | 1,800 | — |
| 32 | 32 | 32 | — | — | — | — | — | — |
| — | 640 | 518 | ල. නො. | 874 | 1,104 | ල. නො. | 906 | 1,025 |
| — | 74 | 61 | — | 154 | 195 | — | 230 | 299 |
| — | 33 | 35 | — | 10 | 5 | — | 3 | 3 |
| — | ල. නො. | — | — | 9 | — | — | 18 | — |
| — | — | — | — | 191 | — | — | 285 | — |

මූලයන්: ඒ ඒ සංස්ථාව විසින් සපයන ලද දත්ත ඇසුරෙනි.

## රාජ්‍ය අංශයේ කර්මාන්තයන්ගේ නිෂ්පාදන වටිනාකම, විකුණුම්,

| සංස්ථාව[1] | නිෂ්පාදන වටිනාකම[2] 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* | විකුණුම් 1967/68 | 1968/69 |
|---|---|---|---|---|---|---|
| 1. ජාතික කිරි මණ්ඩලය .. | 10,629 | 21,672 | 45,925 | 67,256 | 13,227 | 24,092 |
| (අ) සකස් කිරීම සහ වෙනත් .. | 10,629 | 12,855 | 19,945 | 27,632 | 13,227 | 17,465 |
| (ආ) උකු කිරි කම්හල .. | — | 8,817 | 17,775 | 13,700 | — | 6,627 |
| (ඇ) පිටිකිරි යෝජනා ක්‍රමය .. | — | — | 8,205 | 25,924 | — | — |
| 2. ලංකා තෙල් සහ මේද .. | 21,576 | 33,825 | 31,751 | 37,756 | 18,747 | 23,225 |
| 3. ශ්‍රී ලංකා සීනි[5] .. | 17,087 | 16,410 | 24,701 | 27,623 | 21,778 | 25,232 |
| (අ) කන්තලේ කම්හල .. | 3,590 | 7,785 | 12,542 | 11,817 | 10,008 | 16,713 |
| (ආ) ගල්ඔය කම්හල .. | 13,497 | 8,625 | 12,159 | 15,806 | 11,769 | 8,519 |
| 4. රාජ්‍ය පිටි නිෂ්පාදන .. | — | 3,963 | 30,581 | 38,317 | — | 5,520 |
| (අ) පිටි .. | — | 3,963 | 25,638 | 31,904 | — | 4,063 |
| (ආ) අතුරු නිෂ්පාදන .. | — | ල. නො. | 4,943 | 6,413 | — | 1,457 |
| 5. ජාතික ලුණු .. | 9,000 | 8,054 | 4,472 | 2,538 | 7,025 | 7,543 |
| 6. ජාතික පේෂ කර්ම .. | | | | | 51,354 | 65,028 |
| (අ) නිෂ්පාදිතය .. | | | | | | |
| I. වේයන්ගොඩ කම්හල .. | 13,596 | 25,498 | 34,471 | 32,603 | 14,846 | 13,728 |
| II. තුල්හිරිය කම්හල .. | — | — | — | — | — | — |
| III. වෙනත් .. | — | — | — | — | — | — |
| (ආ) වෙළඳාම[7] .. | 40,372 | 46,473 | 37,712 | ල. නො. | 36,508 | 51,300 |
| 7. ලංකා සම්භාණ්ඩ .. | 6,548 | 7,033 | 6,901 | 8,749 | 4,888 | 6,975 |
| (අ) සපත්තු කම්හල .. | 4,604 | 4,716 | 4,646 | 6,054 | 4,412 | 6,294 |
| (ආ) සම් පදම් කිරීමේ කම්හල .. | 1,944 | 2,317 | 2,255 | 2,695 | 476 | 681 |
| 8. නැගෙනහිර කඩදසි කර්මාන්ත .. | | | | | 33,970 | 44,938 |
| (අ) නිෂ්පාදිත .. | 15,268 | 15,986 | 22,856 | 29,036 | 15,572 | 28,192 |
| I. කඩදසි කම්හල .. | — | — | — | — | — | — |
| II. කඩදසි බෝඩ් කම්හල .. | — | — | — | — | — | — |
| (ආ) වෙළඳාම[7] .. | 6,850 | 6,500 | 9,097 | 12,275 | 18,398 | 16,746 |
| 9. රාජ්‍ය මුද්‍රණ .. | — | — | — | ල. නො. | — | — |
| 10. ලංකා තුනී ලෑලි .. | | | | | 7,839 | 10,265 |
| (අ) ගිංතොට කම්හල .. | 5,240 | 7,392 | 5,552 | 7,246 | 7,839 | 10,265 |
| (ආ) අවිස්සාවේල්ල කම්හල .. | — | — | — | — | — | — |
| 11. රාජ්‍ය දැව .. | — | 3,825 | ල. නො. | ල. නො. | — | 8,217 |
| 12. පරන්තන් රසායන ද්‍රව්‍ය .. | | | | | 4,777 | 5,278 |
| (අ) නිෂ්පාදිත .. | 2,416 | 2,242 | 2,262 | 2,654 | 2,442 | 2,390 |
| (ආ) වෙළඳාම[7] .. | 1,111 | 942 | 1,745 | 2,136 | 2,335 | 2,888 |
| 13. ලංකා ටයර් .. | 11,317 | 18,178 | 35,088 | 61,342 | 8,540 | 25,838 |
| 14. ලංකා පොහොර .. | 46,346 | 74,433 | 52,007 | 88,889 | 70,216 | 104,678 |
| 15. ලංකා ඛනිජ තෙල් .. | | | | | | |
| (අ) තෙල් පිරිපහදුව .. | — | 57,755 | 175,419 | 185,088 | — | 55,903 |
| (ආ) තෙල් මුසු කම්හල .. | — | — | — | — | — | — |
| 16. ලංකා ආයුර්වේද ඖෂධ .. | — | — | 1,052 | 2,420 | — | — |
| 17. ලංකා පොහොර නිෂ්පාදන .. | — | — | — | — | — | — |
| 18. ලංකා පිඟන් භාණ්ඩ .. | 7,128 | 8,842 | 8,204 | 9,644 | 10,697 | 12,982 |
| (අ) මීගමුව කම්හල .. | 2,663 | 2,749 | 2,489 | 2,635 | 4,034 | 4,599 |
| (ආ) පිළියන්දල කම්හල .. | 4,067 | 5,658 | 5,231 | 6,469 | 5,927 | 7,589 |
| (ඇ) පිඟන් මැටි පිරිපහදුව .. | 398 | 435 | 484 | 540 | 736 | 794 |
| 19. ලංකා සිමෙන්ති .. | 38,578 | 54,441 | 58,753 | 99,187 | 39,898 | 40,121 |
| (අ) කන්කසන්තුරේ කම්හල .. | 28,888 | 33,257 | 39,526 | 42,000 | 29,656 | 30,456 |
| (ආ) ගාල්ල කම්හල .. | 9,690 | 21,184 | 19,227 | 24,000 | 10,242 | 9,665 |
| (ඇ) පුත්තලම කම්හල .. | — | — | — | 33,187 | — | — |
| 20. ජාතික සුළු කර්මාන්ත .. | 8,662 | 8,234 | 7,937 | 9,806 | 8,479 | 7,703 |
| (අ) වඩු වැඩ අංශය .. | 4,584 | 4,149 | 4,561 | 5,474 | 4,624 | 4,043 |
| (ආ) ගඩොල් සහ උළු කම්හල .. | 2,710 | 3,005 | 3,376 | 4,332 | 3,393 | 2,570 |
| (ඇ) ආයුර්වේද ඖෂධ කම්හල .. | 1,368 | 1,080 | — | — | 462 | 1,090 |
| 21. ලංකා ඛනිජ වැලි .. | 1,543 | 1,769 | 3,321 | 3,770 | 2,503 | 3,385 |
| (අ) ඉල්මනයිට් කම්හල .. | 1,543 | 1,155 | 1,764 | 2,161 | 2,503 | 3,385 |
| (ආ) අතුරු නිෂ්පාදිත කම්හල .. | — | 614 | 1,557 | 1,609 | — | — |
| 22. ලංකා වානේ .. | | | | | 25,665 | 26,157 |
| (අ) නිෂ්පාදනය .. | 24,258 | 31,148 | 26,599 | 48,350 | 25,665 | 25,461 |
| (ආ) වෙළඳාම[7] .. | — | — | ල. නො. | ල. නො. | — | 696 |
| 23. ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ .. | 5,031 | 5,008 | 3,618 | 17,625 | 2,564 | 3,122 |
| (අ) ලෝහ භාණ්ඩ කම්හල .. | 5,031 | 5,008 | 3,618 | ල. නො. | 2,564 | 3,122 |
| (ආ) යකඩ වාත්තු කම්හල .. | — | — | — | ල. නො. | — | — |
| 24. ලංකා ධීවර[9] .. | 6,986 | 16,043 | ල. නො. | ල. නො. | 8,239 | 8,779 |
| 25. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව පළතුරු ඇසිරීමේ කම්හල .. | 1,935 | 2,877 | ල. නො. | ල. නො. | 1,857 | 3,704 |
| 26. රජයේ ස්කාගාරය .. | 1,510 | 1,685 | 2,684 | ල. නො. | 1,360 | 1,618 |

1. දත්ත ගිණුම් වර්ෂ සඳහා‍ය. උදා:– රාජ්‍ය සංස්ථා අප්‍රේල් සිට මාර්තු. ජාතික කිරි මණ්ඩලය ජනවාරි සිට දෙසැම්බර්. පළතුරු ඇසිරීමේ කම්හල සහ රජයේ ස්කාගාරය ඔක්තෝබර් සිට සැප්තැම්බර්. ජාතික කිරි මණ්ඩලයේ 1970 වර්ෂය සඳහා දී ඇති තාවකාලික ගිණුම් හැරෙන්නට ඉතිරි සියළුම නවතම ගිණුම් අයවැය ගතය.
2. කම්හලෙන් පිටවන අවස්ථාවේ නිෂ්පාදන වටිනාකම. ආයාත වටිනාකම (මි.ර.ගැ.)
3. අයබදු ගැනීමට පෙර. 4. වර්ෂාවසානයට සමුච්චිතය. 5. ආයෝජිත ප්‍රාග්ධනය වත්කම්වල වටිනාකම මතය.
6. තොග වටිනාකම් දී ඇති 1967/68 සහ 1967/68 වර්ෂයන් සඳහා හැරෙන්නට ඉතිරි වර්ෂයන් සඳහා දී ඇත්තේ ලේඛාවලින් පිටවන අවස්ථාවේ නිෂ්පාදන වටිනාකමය.

## ලාභ අලාභ සහ ආයෝජනය· 1966/67 සිට 1970/71

රුපියල් දහස් ගණනින්

| වටිනාකම | | ලාභය (+) හෝ අලාභය (−)³ | | | | ප්‍රාග්ධන ආයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1969/70 | 1970/71* | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* |
| **44,972** | **75,773** | **− 1,771**** | **− 950** | **− 98** | **+ 2,306** | **18,852** | **23,273‡** | **29,702‡** | **29,702‡** |
| 17,971 | 29,287 | − 1,771 | − 1,400 | − 2,300 | − 1,500 | 13,156 | 14,507 | 14,507 | 14,507 |
| 20,849 | 16,179 | — | + 450 | + 775 | + 900 | 5,696 | 6,300 | 5,680 | 5,680 |
| 6,152 | 30,307 | — | — | + 1,427 | + 2,906 | — | 1,800 | 5,576 | 5,576 |
| **27,719** | **38,763** | **+ 1,000** | **+ 4,552** | **− 2,032** | **+ 1,007** | **21,940** | **27,940** | **27,615** | **27,615** |
| **29,884** | **34,650** | − 1,598 | **+ 5,947** | **+11,148** | **+ 7,921** | **78,334** | **81,115** | **87,123** | **91,211** |
| 15,879 | 18,235 | + 1,785 | + 8,389 | + 7,243 | + 5,682 | 22,803 | 25,081 | 30,083 | 33,399 |
| 14,005 | 16,415 | − 3,383 | − 2,442 | + 3,905 | + 2,239 | 55,531 | 56,034 | 57,040 | 57,812 |
| ල·නො· | **38,317** | — | ල·නො· | **+ 934** | **+ 434** | **19,992** | **25,323** | **32,942** | **32,942** |
| 25,913 | 31,904 | — | — | — | — | — | — | — | — |
| ල·නො· | 6,413 | — | — | — | — | — | — | — | — |
| **8,909** | **9,000** | **+ 2,196** | **+ 1,964** | **+ 2,816** | **+ 2,271** | **8,300** | **13,010** | **15,400** | **21,818** |
| **69,831** | ල·නො· | **+ 381**** | **+ 2,734** | **+ 3,527** | **+10,776** | **69,707** | **98,300** | **251,761** | **310,778** |
| 25,713 | 33,432 | − 1,427** | + 2,734 | + 2,274 | + 9,280 | 50,300 | 50,300 | 50,300 | 50,300 |
| — | — | — | — | — | — | 7,248 | 35,000 | 186,578 | 245,595 |
| — | — | — | — | — | — | 12,199 | 12,700 | 14,883 | 14,883 |
| 44,118 | ල·නො· | + 1,808** | ල·නො· | + 1,253 | + 1,496 | — | — | — | — |
| **6,279** | **10:408** | **+ 94**** | **+ 168** | **− 221** | ල·නො· | **6,245** | **7,147** | **10,477** | **12,002** |
| 5,410 | 9,396 | ල· නො· | ල· නො· | ල නො· | ල·නො· | 4,225 | 4,225 | 4,225 | 4,225 |
| 869 | 1,012 | ල· නො· | ල·නො· | ල·නො· | ල·නො· | 2,020 | 2,922 | 6,252 | 7,777 |
| **43,821** | **58,861** | **+ 4,575** | **+ 8,396** | **+ 4,175** | **+ 3,974** | **29,000** | **41,228** | **43,125** | **92,000** |
| 27,246 | 28,402 | + 1,496 | + 5,540 | + 3,785 | + 2,098 | 29,000 | 41,228 | 43,125 | 92,000 |
| — | — | — | — | — | — | 29,000 | 29,000 | 29,000 | 29,000 |
| — | — | — | — | — | — | — | 12,228 | 14,125 | 63,000 |
| 16,575 | 30,459 | + 3,079 | + 2,856 | + 390 | + 1,876 | — | — | — | — |
| — | 4,200‡‡ | — | — | — | **+ 1,800** | — | ල·නො· | **3,600** | **6,200** |
| **8,446** | **13,557** | **+ 70**** | **+ 1,886** | **+ 585** | **+ 1,587** | **3,456** | **12,309** | **76,912** | **76,912** |
| 8,446 | 13,557 | + 70 | + 1,886 | + 585 | + 1,587 | 2,800 | 2,800 | 2,800 | 2,800 |
| — | — | — | — | — | — | 656 | 9,509 | 74,112 | 74,112 |
| ල·නො· | ල·නො· | — | **− 612** | ල·නො· | ල·නො· | — | **10,103** | ල·නො· | ල·නො· |
| **5,510** | **6,626** | **+ 269**** | **+ 336** | **+ 906** | **+ 657** | **11,802** | **11,802** | **11,802** | **11,802** |
| 2,462 | 3,186 | − 174 | − 622 | − 325 | − 612 | 11,802 | 11,802 | 11,802 | 11,802 |
| 3,048 | 3,440 | + 841 | + 958 | + 1,231 | + 1,269 | — | — | — | — |
| **26,938** | **46,109** | **+ 355**** | **+ 3,674** | **+ 3,300** | **+ 8,823** | **67,525** | **67,525** | **67,525** | ල·නො· |
| **85,830** | **134,187** | **+ 3,675** | **+15,910** | **+ 3,711** | **+ 7,219** | **12,099** | **20,938** | **27,623** | **54,596** |
| ල·නො· | ල·නො· | — | ල·නො· | ල·නො· | ල·නො· | 61,290 | 103,160 | 180,000 | 186,900 |
| 20,805 | 19,307 | — | — | + 3,137 | + 3,070 | 2,794 | 4,595 | 6,000 | 7,500 |
| 1,050 | **2,417** | — | — | **+ 136** | — 18 | — | — | **1,367** | **2,131** |
| — | — | — | — | — | — | **715** | **4,856** | ල·නො· | ල·නො· |
| **12,028** | **17,646** | **+ 3,548**** | **+ 4,303** | **+ 3,423** | **+ 3,501** | **20,000** | **20,030** | **20,030** | **20,030** |
| 4,189 | 4,500 | + 1,115 | + 1,184 | + 1,079 | + 900 | 5,000 | 5,000 | 5,000 | 5,000 |
| 7,961 | 12,204 | + 2,217 | + 3,094 | + 2,286 | + 2,499 | 11,925 | 11,955 | 11,955 | 11,955 |
| 878 | 942 | + 176 | + 25 | + 118 | + 102 | 3,075 | 3,075 | 3,075 | 3,075 |
| **61,720** | **98,215** | **+13,568**** | **+13,160** | **+27,374** | **+36,562** | **110,138** | **170,114** | **186,223** | **211,760** |
| 41,192 | 42,000 | ල· නො· | +13,070 | +21,531 | +19,485 | 52,120 | 65,952 | 88,232 | 100,152 |
| 20,528 | 24,000 | ල· නො· | + 90 | + 5,843 | + 5,833 | 14,489 | 18,234 | 15,991 | 17,608 |
| — | 32,215 | — | — | — | +11,244 | 43,529 | 85,928 | 82,000 | 94,000 |
| **7,714** | **9,806** | **− 1,993** | **− 1,636** | **− 1,722** | **− 876** | **19,021** | **20,881** | **24,360** | **31,127** |
| 4,373 | 5,474 | − 748 | − 641 | − 1,369 | − 667 | 2,378 | 3,132 | 2,478 | 2,575 |
| 3,341 | 4,332 | − 975 | − 685 | − 353 | − 209 | 15,443 | 16,549 | 21,882 | 28,552 |
| — | — | − 270 | − 310 | — | — | 1,200 | 1,200 | — | — |
| **7,087** | **8,295** | **+ 192** | **+ 1,088** | **+ 2,179** | **+ 3,146** | **14,600** | **14,782** | **15,930** | **18,162** |
| 4,089 | 4,297 | + 192 | ල·නො· | — | — | 11,100 | 11,100 | 11,937 | 12,820 |
| 2,998 | 3,998 | — | ල·නො· | + 2,179 | + 3,146 | 3,500 | 3,682 | 3,993 | 5,342 |
| **39,732** | **61,207** | **+ 2,923**** | **+ 2,650** | **+ 2,567** | **+ 2,391** | **117,000** | **117,000** | **117,000** | **118,000** |
| 39,732 | 61,207 | + 2,923 | + 2,880 | + 2,567 | + 2,391 | 117,000 | 117,000 | 117,000 | 118,000 |
| ල·නො· | ල·නො· | — | − 230 | ල·නො· | n·a· | — | — | — | — |
| **4,921** | **17,055** | **− 37** | **− 706** | **− 4,782** | **− 624** | **30,170** | **36,167** | **38,040** | **38,040** |
| 4,921 | 9,763 | − 37 | − 706 | − 3,029 | − 988 | 15,667 | 16,282 | 16,133 | 16,133 |
| — | 7,292 | — | — | − 1,753 | + 364 | 14,503 | 19,885 | 21,907 | 21,907 |
| **13,167** | **23,998** | **− 3,553** | **− 2,800** | ල·නො· | ල·නො· | **13,632** | **53,799** | **84,306** | **95,306** |
| **3,614** | ල·නො· | **+ 510** | **+ 668** | ල·නො· | ල·නො· | **360** | ල·නො· | ල·නො· | ල·නො· |
| 2,491 | ල·නො· | − 99 | − 18 | + 320†† | — | 2,158 | 2,255 | 2,586 | ල·නො· |

මූලය: ඒ ඒ සංස්ථා විසින් දත්තයන් සපයන ලදී·

7· නිෂ්පාදිත වටිනාකම ආයාත වටිනාකම මතය· 8· තේ පෙට්ටි සඳහා නිෂ්පාදන වටිනාකම පමණි.

9· 1969/70 සහ 1970/71 වර්ෂයන් සඳහා ප්‍රාග්ධන වියදම ජනවාරි සිට දෙසැම්බර් සඳහාය.

* තාවකාලිකය. † තොග වටිනාකම මත නිෂ්පාදන වටිනාකම දී ඇත.

** විෂ නැසු කිරි ව්‍යාපාරය ඇතුළත් ය. †† ඇස්තමේන්තු කළ සංඛ්‍යාය.

‡ වර්ෂය සඳහා මුළු ආදායම. ‡‡ සංශෝධිත සංඛ්‍යා ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව පදනම් කොට ඇත.

## II (ඇ) 3 වැනි සංඛ්‍යා සටහන

## රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථා – ප්‍රාග්ධන ඵලය

රුපියල් දහස් ගණනින්

| සංස්ථාව | ප්‍රාග්ධන ආයෝජනය* 1969/70 | ලාභය (+) හෝ අලාභය (–) | ප්‍රාග්ධන ඵලය |
|---|---|---|---|
| ජාතික කිරි මණ්ඩලය .. | 29,702 | – 98 | — |
| ලංකා තෙල් සහ මේද .. | 27,615 | – 2,032 | — |
| ශ්‍රී ලංකා සීනි .. | 87,123 | + 11,148 | 12·79% |
| රාජ්‍ය පිටි නිෂ්පාදන .. | 32,942 | + 934 | 2·84% |
| ජාතික ලුණු .. | 15,400 | + 2,816 | 18·29% |
| ජාතික පේෂකර්ම .. | 251,761 | + 3,527 | 1·4% |
| ලංකා සම්භාණ්ඩ .. | 10,477 | – 221 | — |
| නැගෙනහිර කඩදාසි .. | 43,125 | + 4,175 | 9·68% |
| රාජ්‍ය මුද්‍රණ .. | 3,600 | — | — |
| ලංකා තුනී ලෑලි .. | 76,912 | + 585 | 0·76% |
| රාජ්‍ය දැව .. | ල. නො. | ල. නො. | — |
| පරන්තන් රසායන ද්‍රව්‍ය .. | 11,802 | + 906 | 7·68% |
| ලංකා ටයර් .. | 67,525 | + 3,300 | 4 89% |
| ලංකා පොහොර .. | 27,623 | + 3,711 | 13·43% |
| ලංකා ආයුර්වේද ඖෂධ .. | 1,367 | + 136 | 9·95% |
| රාජ්‍ය පොහොර නිෂ්පාදන .. | — | — | — |
| ලංකා පිහන් .. | 20,030 | + 3,483 | 17·33% |
| ලංකා සිමෙන්ති .. | 186,223 | + 27,374 | 14·69% |
| ජාතික සුළු කර්මාන්ත .. | 24,360 | – 1,722 | — |
| ලංකා ඛනිජ වැලි .. | 15,930 | + 2,179 | 13·62% |
| ලංකා වානේ .. | 117,000 | + 2,567 | 2·19% |
| ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ .. | 38,040 | – 4,782 | — |
| ලංකා ධීවර .. | 84,306 | ල. නො. | — |

* සමුච්චිතය

## සංඛ්‍යා සටහන II ඇ (4)

## රාජ්‍ය අංශයේ කර්මාන්තයන්ගේ සේවා නියුක්තිය — 1966/67 සිට 1970/71

| සංස්ථාව1 | | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 | 1970/71* |
|---|---|---|---|---|---|---|
| 1· ජාතික කිරි මණ්ඩලය | .. | **889** | **1,241** | **1,092** | **1,212** | **1,354** |
| (අ) සකස් කිරීම හා බෙදා හැරීම | .. | 889 | 1,104 | 910 | 894 | 1,014 |
| (ආ) උකු කිරි කම්හල | .. | — | 137 | 182 | 213 | 208 |
| (ඇ) පිටි කිරි කම්හල | .. | — | — | — | 105 | 132 |
| 2· ලංකා තෙල් සහ මේද | .. | 696 | 697 | 722 | 762 | 762 |
| 3· ශ්‍රී ලංකා සීනි | .. | 1,104 | 2,215 | 2,220 | 2,234 | 2,234 |
| 4· රාජ්‍ය පිටි නිෂ්පාදන | .. | — | 63 | 413 | 425 | 463 |
| 5· ජාතික ලුණු | .. | 946 | 1,948 | 1,309 | 1,200 | 1,250 |
| 6· ජාතික පේෂකර්ම | .. | 1,564 | 1,810 | 1,954 | ල·නො· | 2,748 |
| 7· ලංකා සම්භාණ්ඩ | .. | 588 | 613 | 688 | 690 | 732 |
| 8· නැගෙනහිර කඩදාසි කර්මාන්ත | .. | 1,202 | 1,333 | 1,379 | 1,242 | 1,614 |
| 9· රාජ්‍ය මුද්‍රණ | .. | — | — | ල·නො· | 92 | 102 |
| 10· ලංකා තුනී ලෑලි | .. | 769 | 770 | 852 | 1,235 | ල·නො· |
| 11· රාජ්‍ය දැව | .. | — | — | 1,228 | ල·නො· | ල·නො· |
| 12· පරන්තන් රසායනික ද්‍රව්‍ය | .. | 263 | 312 | 300 | 317 | 321 |
| 13· ලංකා ටයර් | .. | 760 | 792 | 1,095 | 1,302 | 1,485 |
| 14· ලංකා පොහොර | .. | 112 | 160 | 212 | 271 | 388 |
| 15· ලංකා ඛනිජ තෙල් පිරිපහදුව* | .. | — | — | 378 | 477 | 477 |
| 16· ලංකා ඛනිජ තෙල්-තෙල් මුසු කම්හල | .. | — | — | — | 66 | 78 |
| 17· ලංකා ආයුර්වේද ඖෂධ | .. | — | — | — | 147 | 147 |
| 18· ලංකා පොහොර නිෂ්පාදන | .. | — | 8 | 33 | 114 | 131 |
| 19· ලංකා පිඟන් භාණ්ඩ | .. | 829 | 891 | 904 | 978 | 1,212 |
| 20· ලංකා සිමෙන්ති | .. | 1,366 | 1,898 | 1,786 | 1,689 | 2,600 |
| 21· ජාතික සුළු කර්මාන්ත | .. | 1,808 | 1,917 | 1,880 | 1,755 | 2,060 |
| 22· ලංකා ඛනිජ වැලි | .. | 101 | 180 | 389 | 550 | 620 |
| 23· ලංකා වානේ | .. | 596 | 950 | 953 | 960 | 1,000 |
| 24· ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ | .. | 606 | 2,210 | 1,081 | 1,001 | 1,055 |
| 25· ලංකා සීවර | .. | 1,362 | 1,380 | 1,308 | 1,769 | ල·නො· |
| 26· අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ පළතුරු ඇසිරීමේ කම්හල | .. | 150 | 150 | 155 | 170 | ල·නො· |
| 27· රජයේ ස්කාගාරය | .. | 71 | 72 | 73 | 73 | ල·නො· |

මූලය: දත්තයන් ඒ ඒ ආයතන විසින් සපයන ලදී

1· සංඛ්‍යා ගිණුම් වර්ෂයනට අනුකූලය. උදහරණ: කාර්මික සංස්ථා අප්‍රේල් සිට මාර්තු. ජාතික කිරි මණ්ඩලය සහ ඛනිජ තෙල් සංස්ථා ජනවාරි සිට දෙසැම්බර්, පළතුරු ඇසිරීමේ කම්හල සහ රජයේ ස්කාගාරය ඔක්තෝබර් සිට සැප්තැම්බර්.

* තාවකාලික හෝ ඇස්තමේන්තු කරන ලද.

### 1. ආහාර පාන වර්ග සහ දුම්කොළ

### (අ) ජාතික කිරි මණ්ඩලය

ජාතික කිරි මණ්ඩලය මගින් කරන ලද ප්‍රාග්ධන ආයෝජන 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 29·7 දක්වා සියයට 28 කින් වැඩිවී ඇත. මණ්ඩලයේ මුළු නිෂ්පාදන වටිනාකම 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 21·6 ක් වූ අතර, 1969/70 වර්ෂයේ දෙගුණයකින් පමණ වැඩිවී, රුපියල් දශලක්ෂ 45·9 ක් විය. මේ නිසා මණ්ඩලයට 1968/69 වර්ෂයේ රු. 9,50,000 ක් වූ අලාභය රු. 98,000 දක්වා 1969/70 වර්ෂයේදී අඩුකර ගැනීමට සමත් විය.

### (ආ) ලංකා තෙල් සහ මේද සංස්ථාව

1968/69 වර්ෂයේ නිෂ්පාදන වටිනාකම වූ රුපියල් දශලක්ෂ 33·8 හා සසඳන කල, 1969/70 වර්ෂයේ එය රුපියල් දශලක්ෂ 31·7 ක් විය. මෙම වර්ෂ දෙක අවසානයේ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජන පිළිවෙලින් රුපියල් දශලක්ෂ 27·9 ක් සහ රුපියල් දශලක්ෂ 27·6 ක් විය.

1967/68 සහ 1968/69 වර්ෂවල මෙම සංස්ථාව ලාබ ලැබුවත්, 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 2·0 ක අලාභයක් ලබා ඇත. 1967 නොවැම්බර් මස රුපියලේ වටිනාකම අවප්‍රමාණ කළ පසුවද, සත්ව කර්මාන්තයට සහාය දීමක් වශයෙන් අවප්‍රමාණයට

පෙර පැවති සත්ව ආහාර මිල පවත්වාගෙන යන ලෙස රජය මගින් සංස්ථාවෙන් ඉල්ලා ඇත. මෙහිප්‍රතිඵලයක් වශයෙන් ලැබූ අලාභය දීමනාවක් මගින් පියවන ලද අතර, පසුගිය වර්ෂවල සංස්ථාවේ ලාභ ගණනය කිරීමේදී මෙම දීමනා සැලකිල්ලට භාජනය කොට ඇත. 1969/70 වර්ෂයේ සිට මෙම දීමනාව ලාභ ගණනය කිරීමේදි නොසලකා හැර ඇති අතර, 1969/70 දී අලාභ ලැබීමට මෙය ප්‍රධාන හේතුවවී ඇත.

ග්ලෙසරින් සහ මේද අම්ල නිර්යාත කිරීමෙන් විදේශ විනිමය ඉපයීමේ කටයුතුවල සංස්ථාව තව දුරටත් නිරත වෙයි. 1969/70 වර්ෂයේ මේද අම්ල ටොන් 876 ක් නිර්යාත කොට රුපියල් දශලක්ෂ 1·6 ක්ද, ග්ලෙසරින් ටොන් 149·5 ක් නිර්යාත කිරීමෙන් රු. 253,200 ක් ද උපයාගෙන ඇත.

**(ඇ) ශ්‍රී ලංකා සීනි සංස්ථාව**

සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජන 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 6 කින් වැඩිවී රුපියල් දශලක්ෂ 87·1 ක් විය. මෙම වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 5·0 ක් කන්තලේ කම්හල සඳහා වන අතර, රුපියල් දශලක්ෂ 1·0 ක් ගල්ඔය කම්හල සඳහා විය. නිෂ්පාදන වටිනාකම 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 14·4 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 24·7 දක්වා වැඩිවී ඇත.

කන්තලේ කම්හලෙහි නිමැවුම් සහ විකුණුම් ප්‍රමාණය 1969/70 වර්ෂයේ ටොන් 1825 කින් ටොන් 5478 දක්වා වැඩිවී ඇත. ස්ප්‍රීත්තු නිමැවුම ගැළුම් 832,000 සිට 768,000 දක්වා අඩු වූ අතර, විකුණුම් ප්‍රමාණය ගැළුම් 795,000 සිට 770,000 දක්වා අඩුවී ඇත. සීනි සහ ස්ප්‍රීතුවල විකුණුම් වටිනාකම 1969/70 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 16·7 සිට රුපියල් දශලක්ෂ 15·9 දක්වා අඩුවී ඇත. 1968/69 වර්ෂයේ කන්තලේ කම්හලේ මුළු ලාභය රුපියල් දශලක්ෂ 8·4 සිට 1969/70 වර්ෂයේ දී රුපියල් දශලක්ෂ 7·2 දක්වා අඩුවී ඇත.

ගල්ඔය කම්හලේ සීනි නිෂ්පාදනය 1968/69 වර්ෂයේ ටොන් 4700 ක් වූ අතර, 1969/70 වර්ෂයේදී එය ටොන් 3700 දක්වා අඩුවී ඇත. එහෙත් ස්ප්‍රීතු නිෂ්පාදනය ගැළුම් 473,000 සිට 673,000 දක්වා වැඩිවී ඇති අතර, විකුණුම් ප්‍රමාණය ගැළුම් 317,000 සිට 636,000 දක්වා වැඩිවී ඇත. නිෂ්පාදනය කල ස්ප්‍රීත්තු වල වටිනාකම රුපියල් දශලක්ෂ 8·6 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 12·2 දක්වා වැඩිවී ඇත.

පසුගිය වර්ෂවලදී මෙන්ම 1969/70 වර්ෂයේදී ද ස්ප්‍රීතුවලින් ලත් ආදයමින් සීනි වලින් ලත් අලාභය පියවා ගැනීමට සංස්ථාවට හැකිවී ඇත. 1969/70 වර්ෂයේ සංස්ථාවේ මුළු ලාභය රුපියල් දශලක්ෂ 11·1 ක් විය.

ලංකාවේ සීනි කර්මාන්තය එහි මුල් කාලයේ සිටම වැරදි ක්‍රම සම්පාදනය සහ පරිපාලනය නිසා දුෂ්කරතාවලට මුහුණ දුන්නකි. සීනි වඩා අන්තර්ගත, ප්‍රමාණවත් උක්දඩු සැපයුමක් ඇතිවන තුරු, සීනි මගින් පමණක් ලාභයක් ලැබීම අපහසුය. නමුත් සීනි කර්මාන්තයේ ලබන අලාභ වඩාත් ලාභදයක ස්ප්‍රීතු නිෂ්පාදනය මගින් අඩුකර ගැනීමට සංස්ථාවට හැකිවී ඇත.

**(ඈ) රාජ්‍ය පිටි නිෂ්පාදන සංස්ථාව**

1969/70 වර්ෂයේ සංස්ථාවේ මුළු ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශලක්ෂ 7·6 කින්, රුපියල් දශලක්ෂ 32·9 දක්වා වැඩිවී ඇත. 1968/69 වර්ෂයේ ටොන් 11,031 ක්වූ පිටි සහ වෙනත් නිෂ්පාදන ප්‍රමාණය 1969/70 වර්ෂයේ ටොන් 56,991 දක්වා වාර්තාගත වැඩිවීමක් දක්වා ඇත. කෙසේ වෙතත්, මෙය වාර්ෂික උපරිම නිෂ්පාදන ධාරිතාව වූ ටොන් 70,000 වඩා අඩු ප්‍රමාණයකි. 1969/70 වර්ෂයේ සංස්ථාව රු. 934,000 ක ලාභයක් ලබා ඇත.

**(ඉ) ජාතික ලුණු සංස්ථාව**

1969/70 මුළු ලුණු නිෂ්පාදනය පසුගිය වර්ෂයට වඩා ටොන් 11,900 කින් හෙවත් සියයට 11 කින් වැඩිවී ඇති අතර, 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 1·9 ක් වූ ලාභය 1969 /70 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 2·8 දක්වා සියයට 43 කින් පමණ වැඩිවී ඇත. නිෂ්පාදනයෙහි සහ ලාභයෙහි වැඩිවීම සමහර විට වර්ෂය තුළ පැවති යහපත් කාලගුණය සහ 1968/69 රුපියල් දශලක්ෂ 13·0 ක් වූ ආයෝජන 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 15·4 දක්වා වැඩිවීම නිසා විය හැක. පසුගිය වර්ෂ දෙකේ ගෙන ආ නොවිකුණු විශාල ලුණු තොග තිබුණත්, වැඩි ලාභ ලබා ඇති අතර, මෙම තොග 1970/71 වර්ෂයේ විකිණීමට බලාපොරොත්තු වෙයි.

**2. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම් කර්මාන්තය**

**(අ) ජාතික පේෂකර්ම සංස්ථාව**

මෙම සංස්ථාවේ මුළු ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 98·3 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 154 කින්, රුපියල් දශලක්ෂ 251·8 දක්වා වැඩිවිය. මෙයින් රුපියල් දශලක්ෂ 152 ක් තවම වැඩ අවසන්කොට නොමැති තුල්හිරියේ නව පේෂකර්ම කම්හල සඳහා වෙයි. වෙයන්ගොඩ පේෂකර්ම කම්හල සඳහා පසුගිය වර්ෂ කිහිපය තුළ අමතර ආයෝජන නොවූවත්, නූල් සහ රෙදි නිෂ්පාදනය සැලකියයුතු ලෙස වැඩිවී ඇති අතර, මෙම කම්හලෙහි ප්‍රාග්ධන නිමැවුම් අනුපාතය 1968/69 වර්ෂයේ 2 සිට 1969/70 වර්ෂයේ 1·4 දක්වා වර්ධනය වී ඇත.

සංස්ථාව විසින් 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 3·5 ක ලාභයක් ලබා ඇති අතර, 1968/69 වර්ෂයේ මෙම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2·7 ක් විය. මින් රුපියල් දශලක්ෂ 1·3 ක් එහි වාණිජ කටයුතුවලින් ලබා ඇත.

අම්බලන්ගොඩ සහ මින්නේරිය යන ස්ථානවල කම්හල් පිහිටුවීමට සංස්ථාව සැලසුම් කොට ඇත. පූගොඩ පිහිටුවීමට නියමිත වූ, කලක් නතරකොට තිබූ පේෂකර්ම කම්හල පිළිබඳ නැවත සැලකිල්ල යොමු කොට තිබේ. සංස්ථාව තම කපු වගාව පිළිබඳ කටයුතුවල තවදුරටත් නිරතවිය. නමුත් මේ පිළිබඳ සංඛ්‍යා ලැබී නොමැත.

**(ආ) ලංකා සම් භාණ්ඩ සංස්ථාව**

මෙම සංස්ථාවෙහි මුළු ප්‍රාග්ධන ආයෝජනය 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 7·1 ක් වූ අතර, එය සියයට 48 කින් වැඩිවී,1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 10·5 ක් විය. 1969/70 වර්ෂයේ සංස්ථාව නිෂ්පාදනය කළ සපත්තු ජෝඩු ප්‍රමාණය 275,000 සිට 281,000 දක්වා ද, ක්‍රෝම් සම් නිෂ්පාදනය හතරැස් අඩි 667·000 සිට 688,000 දක්වාද වැඩිවූ අතර, බාක් සහ වෙනත් සම් නිෂ්පාදන රාත්තල් 1364,000 සිට 358,000 දක්වා අඩුවිය.

පෞද්ගලික අංශයේ නිෂ්පාදකයන්ගේ තරඟකාරි බවට මුහුණ දීමට සංස්ථාවට සිදුවූ අතර 1968/69 විකුණන ලද 253,000 ක් වූ සපත්තු ජෝඩු ප්‍රමාණය 1969/70 වර්ෂයේ දී 229,000 දක්වා පහල වැටින. කෙසේ වෙතත්, විවිධ නිෂ්පාදන භාණ්ඩ විකිණීමෙන් ලැබූ ආදායම රුපියල් 452,000 සිට 1969/70 වර්ෂයේ රුපියල් 571,000 දක්වා වැඩිවිය. නමුත් සංස්ථාවෙහි සියලුම නිෂ්පාදන විකිණීමෙන් ලත් ආදායම 1968/69 වර්ෂයේ රුපියල් 69,75,000 ක් වූ අතර, 1969/70 වර්ෂයේ එය රුපියල් 62,79,000 දක්වා අඩුවී ඇත. 1968/69 වර්ෂයේදී සංස්ථාව රුපියල් 168,000 ක ලාභයක් ලැබුවද, 1969/70 වර්ෂයේදී රුපියල් 221,000 ක් අලාභ ලැබීය.

**3. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන, මුද්‍රණ සහ ප්‍රකාශන**

**(අ) නැගෙනහිර කඩදාසි සංස්ථාව**

මුළු ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය පසුගිය වර්ෂයට වඩා 1969/70 වර්ෂයේ සියුම් ලෙස වැඩිවිය. 1968/69 වාලච්චෙනෙහි කඩදාසි නිෂ්පාදනය අඩුවූ අතර, 1969/70 වර්ෂයේ නිෂ්පාදනයෙහි වැඩිවීමක් දක්නට ලැබිණි. ආයාත කපා හැරීම සහ අතිරික්ත තොග පැවතීම නිසා, 1966/67 වර්ෂයේ සිට අඩුවෙමින් පැවති කඩදාසි ආයාත කිරීම 1969/70 වර්ෂයේදී තවදුරටත් අඩුවීමක් වාර්තාගතවී ඇත.

1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 8·4 ක් වූ ලාභය 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 4·2 ක් වූයේ සීඝ්‍ර අඩුවීමක් වාර්තාගත කරමිනි.

**(ආ) රාජ්‍ය මුද්‍රණ සංස්ථාව**

රජයේ වැඩිවෙමින් පවත්නා මුද්‍රණ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මූලික වශයෙන් රජය මුද්‍රණ සංස්ථාව පිහිටුවන ලදී. 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 3·6 ක් වූ ප්‍රාග්ධන ආයෝජන 1970/71 දී රුපියල් දශලක්ෂ 6·2 දක්වා වැඩිවේයයි බලාපොරොත්තු වේ. යන්ත්‍ර සූත්‍ර සවිකිරීමේ කටයුතු සම්පූර්ණ නොකළ නිසා, 1970 මාර්තු 31 වෙනි දිනෙන් අවසන්වූ වර්ෂය තුළ සංස්ථාව මගින් මුද්‍රණ කටයුතුවල නියැලුනේ නැත.

**4. දැව සහ දැව නිෂ්පාදිත**

**(අ) ලංකා තුනීලෑලි සංස්ථාව**

1969/70 වර්ෂයේ මෙම සංස්ථාවෙහි මුළු නිෂ්පාදනය පසුගිය වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණයට වඩා අඩුය. 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 7·4 ක් වූ නිෂ්පාදන වටිනාකම 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 5·6 දක්වා පහළ වැටුන අතර, ඒ සමගම මෙම කාල පරිච්ඡේදය තුළ ලාභයද රුපියල් දශලක්ෂ 1·9 සිට රුපියල් දශලක්ෂ 0·6 දක්වා පහල වැටිනි. කෙසේ වෙතත්, සංස්ථාවෙහි මුළු ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 12·3 සිට සිට 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 76·1 දක්වා වැඩිවී ඇත.

මෙම වැඩිවීම තවම වැඩ අවසන් කර නොමැති අවිස්සාවෙල්ලේ දැව නිෂ්පාදන කම්හල සඳහා රුපියල් දශලක්ෂ 64·6 ක ප්‍රාග්ධන සම්පාදන වියදම නිසාය.

සංස්ථාව එහි නිෂ්පාදනය කරනු ලබන පතුරු වර්ග, බුරුත මහෝගනී, කිරිහැඹිලිය, සහ හුලංහික් වැනි වටිනා දැව වර්ගද සඳහා නිර්යාත වෙළඳ පොළක් සොයා ගැනීමට පරිශ්‍රම දරා ඇත. 1969/70 වර්ෂය තුළ රු. 201,000 ක පතුරු වර්ග සහ ලෑලි තහඩු නිර්යාත කොට ඇති අතර, 1970 අප්‍රේල් සිට සැප්තැම්බර් කාලය තුල තුනී ලෑලි තහඩු නිර්යාත කොට රු. 379,000 ක් උපයාගෙන ඇත. සංස්ථාව 1969/70 වර්ෂයේ ලබා ඇති ලාභය ඇස්තමේන්තු කළ අතිරික්තයවූ රුපියල් 2 ලක්ෂයට වඩා අඩුවූවකි.

**(ආ) රාජ්‍ය දැව සංස්ථාව**

දැව සම්පත් ලබා ගැනීම, දැව ඉරීම සහ විකිණීම, මාර්ග තැනීම සහ දැව ලබා ගැනීමට යාන්ත්‍රික ඒකක පිහිටුවීම ආදී කටයුතු කිරීම සඳහා 1968 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාව පිහිටුවන ලදී. වන රක්ෂන දෙපාර්තමේන්තුව විසින් දැව ලබා ගැනීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන් සමග තිබූ කොන්ත්‍රාත් ද, දැව ලබගැනීම සඳහා කැලෑ දෙපාර්තමේන්තුව පාවිච්චි කල යන්ත්‍ර සූත්‍ර, ඉරුම් කම්හල්, දැව සංයුක්ත කිරීමේ සහ පදම් කිරීමේ කම්හල් සහ දැව විකුණුම් ඩිපෝ සියල්ල කැලෑ දෙපාර්තමේන්තුවෙන් පවරා ගන්නා ලදී.

1969/70 වර්ෂයේ නියමිත ක්‍රියාකාරිත්වය පිළිබඳ සංඛ්‍යා සහ 1970/71 වර්ෂය සඳහා ඇස්තමේන්තු සංඛ්‍යාවද ලැබී නැත.

**5. රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත**

**(අ) පරන්තන් රසායන ද්‍රව්‍ය සංස්ථාව.**

1969/70 වර්ෂයේ කොස්ටික් සෝඩා සහ ක්ලෝරීන් නිෂ්පාදනය 1968/69 වර්ෂයට වඩා අඩු මෙන්ම, නියමිත ඉලක්කයට වඩා පහල වැටුන අතර, මේස ලුණු නිෂ්පාදනය 1968/69 වර්ෂයට වඩා වැඩිවී ඇත. සංස්ථාව විසින් තව දුරටත් කොස්ටික් සෝඩා ආයාත කරන ලදී. නිෂ්පාදන කටයුතු අතින් බලනවිට 1968/69 වර්ෂයේ අලාභය රුපියල් දශලක්ෂ 0·6 ක් වූ අතර, 1969/70 එය රුපියල් දශලක්ෂ 0·3 ක් විය. මේ අතර, වාණිජ කටයුතුවලදී ප්‍රධාන වශයෙන් කොස්ටික් සෝඩා ආයාත මගින් එහි

ලාභය රුපියල් 958,000 සිට රුපියල් 1,231,000 දක්වා වැඩිවී ඇත. ඒ සමගම, සංස්ථාව ලැබූ මුළු ලාභය 1968/69 වර්ෂයේ රුපියල් 336,000 සිට 1969/70 වර්ෂයේ රු. 906,000 දක්වා වැඩිවී ඇත,

ඒ අතර සංස්ථාවේ මුළු ප්‍රාග්ධන ආයෝජන පසුගිය වර්ෂවල පැවති රුපියල් දශලක්ෂ 11·8 හි ස්ථාවරව පැවතිණි.

**(ආ) ලංකා ටයර් සංස්ථාව**

1966/67 සිට සංස්ථාවෙහි ස්ථාවරව පැවති ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 67·5 කි, 1969/70 වර්ෂය තුළ ටයර් සහ ටියුබ් නිෂ්පාදනය ඇස්තමේන්තු ඉලක්කයට වඩා බෙහෙවින් අඩු විය, ධාරිතා උපයෝගීතාවය පහල මට්ටමක පැවති අතර, ඊට හේතුවූ ප්‍රධාන කරුණක් නම්, ටයර් නිෂ්පාදනය ප්‍රමාණයන් 6 කට සීමා කිරීම විය හැක. දේශීය වෙළඳ පොලට පමණක් අවශ්‍ය ඒ ඒ ටයර් වර්ග සඳහා නිෂ්පාදනය සීමා කිරීම නිසා ධාරිතා උපයෝගිතාවය තවදුරටත් පහත් මට්ටමක පැවතිය හැක. එක් රැස් වී ඇති තොග ප්‍රමාණයන් ඉතා හෙමින් අඩු වීම නිසාත්, ටියුබ් දිගු කලක් ගබඩා කර තැබීමට ඔරොත්තු නොදෙන නිසාත්, ටියුබ් නිෂ්පාදනය සීමා කරන්නට සිදුවිණි. පුහුණු දක්ෂ ශ්‍රමිකයන් විශේෂයෙන්ම වැද්දුම් ක්‍රියාකරුවන්ගේ හිඟයද ධාරිතා උපයෝගිතාවය පහත බැසීමට තවත් හේතුවක් වශයෙන් දැක්විය හැක.

1969/70 තුළ සංස්ථාවට තම නිෂ්පාදනයන්ගෙන් කිසිවක් නිර්යාත කිරීමට නොහැකි විය. සංස්ථාවේ ලාභ 1968/69 දී රුපියල් දශ ලක්ෂ 3·7 සිට 1969/70 වේ රුපියල් දශ ලක්ෂ 3·3 දක්වා පහත වැටින.

**(ඇ) ලංකා පොහොර සංස්ථාව**

1969/70 වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 20 9 සිට රුපියල් දශ ලක්ෂ 27·6 දක්වා වැඩි විත. 1969 දී සංස්ථාව ඉකුත් වර්ෂයට වඩා අඩුවෙන් පොහොර ආනයනය කළ අතර, 1970/71 වර්ෂය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉලක්කයන්ට අනුකූලව වැඩියෙන් ආනයනය කිරීමට බලාපොරොත්තුවේ.

සංස්ථාවේ ලාභ 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 15·9.සිට 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 3·7 දක්වා අඩුවී ඇත.

**(ඈ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - තෙල් පිරිපහදුව**

පිරිපහදුව සඳහා ප්‍රාග්ධන ආයෝජනය 1969/70 තුල රුපියල් දශ ලක්ෂ 180·0 දක්වා රුපියල් දශ ලක්ෂ 77·0 කින් වැඩිවූ අතර, නිෂ්පාදනයද රුපියල් දශ ලක්ෂ 175·4 දක්වා රුපියල් දශ ලක්ෂ 117·7 කින්වැඩි විත. කෙසේ වෙතත්, පිරිපහදු කම්හලේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ලාභ අලාභ සංඛ්‍යා ලැබී නොමැත.

1970 වේදී විදේශීය විනිමය රුපියල් දශ ලක්ෂ 23 ක් පමණ වටිනා නැප්තා,දැවි තෙල්, බන්කර් නිර්යාත කොට ඇත. 1971 දී රුපියල් දශ ලක්ෂ 39 ක් පමණ උපයන පරිද්දෙන් තම අපනයනයන් වැඩි කිරීමට බලාපොරොත්තු වේ.

ලංකාවට අවශ්‍ය මුළු ඛනිජ තෙල් ප්‍රමාණය සපුරාලීමට පිරිපහදුවට හැකි වී ඇති අතර, 1970 දී එය ද්‍රව්‍යමය පැට්‍රොලියම් වායුව (එල්. පී. ජී.) නිෂ්පාදනය කිරීමට පටන් ගෙන ඇත.

**ලිහිස්සි තෙල් කර්මාන්ත ශාලාව**

මෙම කර්මාන්තශාලාව පටන් ගැන්මට පෙර ලිහිස්සි තෙල් පිටරටවලින් ආනයනය කිරීමට සිදුවූ අතර, මේ සඳහා අධික ඇසුරුම් වියදම් සහ විවිධ නැව් ගාස්තු ද දැරීමට සිදුවිය. මම කම්හල සඳහා යෙදවූ ප්‍රාග්ධන ආයෝජනය 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 4·6 ට 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 6·0 දක්වා වැඩි විය.

ගැලුම් 4,032,000 ක නිෂ්පාදන ධාරිතාවක් ඇති මේ ලිහිස්සි තෙල් කම්හල 1969/70 වර්ෂයේ ලිහිස්සි තෙල් ගැලුම් 3,843,470 ක් නිෂ්පාදනය කළ අතර, රුපියල් දශ ලක්ෂ 3·1 ක ලාභයක් උපයන ලදී.

**(ඉ) ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**

1969 පිහිට වූ මෙම සංස්ථාව 1969 ජූලි මාසයේදී ජාතික කුඩා කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අංශයේ නිෂ්පාදන කටයුතු පවරා ගන්නා ලදී. ආයුර්වේද, සිද්ධ, යුනානි ඖෂධ නිෂ්පාදනය ආනයනය,, අලෙවිය සහ පර්යේෂණ පැවැත්වීම මේ සංස්ථාවේ ප්‍රධාන කටයුතු වන්නේය.

1969/70 වේ මෙම සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1·4 ක් වන අතර, එම වර්ෂයේ නිෂ්පාදන වටිනාකම රුපියල් දශ ලක්ෂ 1·1 කි. 1969/70 වර්ෂයේ සංස්ථාවේ ලාභය රුපියල් 136,000 ක් විය.

**(ඊ) ලංකා පොහොර නිෂ්පාදන සංස්ථාව**

1966 දී පිහිටවනු ලැබූ මෙම සංස්ථාව වර්ෂයකට ටොන් 285,000 ක වාර්ෂික ධාරිතාවක් ඇති යූරියා කර්මාන්ත ශාලාවක් ඇරඹීමට බලාපොරොත්තු වේ. 1969/70 අවසානයේ මේ සංස්ථාවේ දනට නිමවී තිබෙන මූලික වැඩ කටයුතු සඳහා රුපියල් දශ ලක්ෂ 4·9 ක් ආයෝජනය කර ඇත. පොහොර නිෂ්පාදනයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදුවෙන් ලැබෙන නැප්තා උපයෝගී කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු 1975 දී පමණ පටන් ගැනේ.

**6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් නිෂ්පාදන හැර)**

**(අ) ලංකා පිඟන් භාණ්ඩ සංයුක්ත මණ්ඩලය**

ඉකුත් වර්ෂ තුනේදීම මෙම සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 20·03 කි. 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8·8 ක්වූ නිෂ්පාදන වටිනාකම 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8·2 දක්වා සියුම් ලෙස පහල වැටුන අතර, ලාභය රුපියල් දශ ලක්ෂ 4·3 සිට රුපියල් දශ ලක්ෂ 3·4 දක්වා අඩු විය.

සංස්ථාවේ සෞඛ්‍ය රක්ෂණ භාණ්ඩ නිෂ්පාදනය නියමිත ඉලක්කයට වඩා 15% ක් වැඩි වූ අතර, නිෂ්පාදන වැඩිවීම සහ සම්පත් මනා ලෙස උපයෝගී කොට ගැනීම නිසා මෙම කටයුතුවලින් බලාපොරොත්තු වූ ඉලක්කයට වඩා 63% ක ලාභයක් ලැබීමට සංස්ථාව සමත් වී ඇත. ටෙන්ඩර් ක්‍රමයක් යටතේ වැඩි වියදමක් දරා දූදියවලින් මැටි මිලයට ගැනීම නිසා කිරි මැටි ශුද්ධාගාරයේ ලාභ, අය වැය ගත ප්‍රමාණයට වඩා අඩු විය.

**(ආ) ලංකා සිමෙන්ති සංස්ථාව**

1969/70 වර්ෂයේ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය රුපියල් දශ ලක්ෂ 22·3 කින් රුපියල් දශ ලක්ෂ 186·2 දක්වා වැඩිවී ඇත. මෙම ආයෝජන වැඩිවීම සම්පූර්ණයෙන්ම කන්කසන්තුරේ කම්හල මගින් උපයෝගී කොට ගෙන ඇත. කන්කසන්තුරේ සහ ගාල්ලේ කම්හල්වලින් ලත් සංස්ථාවේ මුළු පිරිවැටුම් 1968/69 වර්ෂයේ ටොන් 240,632 සිට 1969/70 වර්ෂයේ ටොන් 268,336 දක්වා වැඩි වී ඇත. 1969/70 වර්ෂයේ කන්කසන්තුරේ කම්හලේ සිමෙන්ති සහ ක්ලින්කර් නිෂ්පාදනය පිළිවෙලින් ටොන් 188,221 සහ ටොන් 244,096 ක් වේ. ගාල්ලේ කම්හලේ පිරිවැටුම සිමෙන්ති ටොන් 80,115 ක් විය. රුපියල් දශ ලක්ෂ 13·2 ක් වූ 1968/69 වර්ෂයේ සංස්ථාවේ ලාභය 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 27·4 දක්වා 100% කින් පමණ වාර්තාගත වැඩිවීමක් පෙන්වයි. නමුත් විකුණුම් වැඩිවූයේ 40% කින් පමණය, ගාල්ලේ කම්හලේ පමණක් ලාභය 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 0·9 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 5·8 දක්වා වැඩිවී ඇත.

**(ඇ) ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය**

1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 24·4 ක්වූ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය පසුගිය වර්ෂවලට වඩා රුපියල් දශ ලක් 5·5 ක වැඩි වීමකි. මෙම වැඩිවීම ගඩොල් සහ උළු කම්හල් සඳහා කරන ලද අමතර ආයෝජන පෙන්නුම් කරයි. 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8·2 ක්වූ නිෂ්පාදන වටිනාකම (ආයුර්වේද ඖෂධ ඇතුලත්ව) 1969/70 රුපියල් දශ ලක්ෂ 7·9 දක්වා අඩුවිය. නමුත් රුපියල් දශ ලක්ෂ 7·7 ක්වූ විකුණුම් වටිනාකම නොවෙනස්ව පැවතුණි. 1968/69 වර්ෂයේ නිෂ්පාදනය හා සසඳා බලන විට, 1969/70 වර්ෂයේ සංස්ථාවේ උළු නිෂ්පාදනය 497,338 ක වැඩිවීමක්ද, ගඩොල් නිෂ්පාදනය 518,016 ක පහල යාමක්ද, වෙනත් මැටි නිෂ්පාදිත 461,292 කින් වැඩිවීමක්ද පෙන්වයි.

අතාත්වික මිලගණන් අනුව රජයට කරන ලද විකුණුම් නිසා පසුගිය දශකය තුළම සංස්ථාවේ වඩු කර්මාන්ත අංශය නැවත නැවතත් අලාභ ලැබීය. ග්‍රාම සංවර්ධන සහ සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුව සඳහා අනුමත කරන ලද මිල ව්‍යුහයක් පදනම් කරගෙන මහා භාණ්ඩාගාරයේ මිල තීරණ කමිටුව මගින් නියම කරන ලද මිල යටතේ පිලිගත් වර්ගයේ ගෘහ භාණ්ඩ රජයේ දෙපාර්තමේන්තුවලට සපයන අතර, එය මූලික පිරිවැයටත් වඩා අඩු වේ. සංස්ථාවේ වඩු කර්මාන්ත වැඩ පොලවල් මගින් නිපදවන ලද ගෘහ භාණ්ඩ වලින් ලත් ආදයම 1968/69 වර්ෂයේ අඩුවූ අතර, 1969/70 වර්ෂයේ එහි වර්ධනයක් දක්නට ඇත. නමුත් මෙම කටයුතුවලින් ලත් අලාභය වැඩිවී ඇත.

පසුගිය වර්ෂ කීපය තුළම අධික ලෙස අලාභ ලැබූ මෙම සංස්ථාව 1969/70 වර්ෂයේදී තවදුරටත් රුපියල් දශ ලක්ෂ 1·7 ක අලාභයක් ලබා ඇති අතර, මෙය ඉකුත් වර්ෂයේ අලාභයට වඩා වැඩි ප්‍රමාණයකි.

**(ඈ) ලංකා ඛනිජ වැලි සංස්ථාව**

1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 14·8 ක්වූ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 15·9 ක්වී ය 1968/69 වර්ෂයේ ඉල්මනයිට් ටොන් 75,986 ක් වූ සංස්ථාවේ නිෂ්පාදන ප්‍රමාණය 1969/70 වර්ෂයේ ටොන් 77,356 දක්වා වැඩි වී ඇත. ඒ අතර, එහි නිර්යාත ප්‍රමාණය 1968/69 වර්ෂයේ ඉල්මනයිට් ටොන් 73,430 සිට 1969/70 වර්ෂයේ 81,482 දක්වා වැඩිවී ඇත. විදේශීය විනිමය ඉපයීම රුපියල් දශ ලක්ෂ 3·39 සිට 4·09 දක්වා වැඩි වී ඇත.

1968/69 වර්ෂයේ රුටයිල් ටොන් 1967 ක් නිෂ්පාදනය කළ සංස්ථාව 1969/70 වර්ෂයේ ටොන් 1549 ක් නිපදවා ඇත. නමුත් 1968/69 වර්ෂයේ සංස්ථාව මගින් රුටයිල් නිර්යාත නොකළ අතර, 1969/70 වර්ෂයේ රුටයිල් ටොන් 2830 ක් නිර්යාත කොට ඇත. 1970 සැප්තැම්බර් මස දක්වා සර්කොන් නිෂ්පාදන පටන් ගැනීමට කලින් බලාපොරොත්තු වූ පරිදි සංස්ථාවට නොහැකිවී ඇත. ඉල්මනයිට් වැඩි වශයෙන් නිපදවීමෙන් සහ විකිණීමෙන්ද ඉහළ මිලක් ඇති රුටයිල් විකිණීමෙන්ද 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 1·1 ක්වූ සංස්ථාවේ ලාභය 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 2·2 දක්වා වැඩිකර ගැනීමට සංස්ථාවට හැකි වී ඇත.

**7. මූලික ලෝහ කර්මාන්ත**

**(අ) ලංකා වානේ සංස්ථාව**

රුපියල් දශ ලක්ෂ 117·0ක්වූ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය පසුගිය වර්ෂ කීපය තුලම නොවෙනස්ව පැවතින. 1968/69 වර්ෂයේ වැඩිවූ රෝල් නිෂ්පාදිත 1969/70 වර්ෂයේදී පහල යාමක් වාර්තාගත වී ඇත. 1968/69 වර්ෂයේ ඉහල ගිය කම්බි නිෂ්පාදිතවල නිමයුම 1969/70 වර්ෂයේ ආන්තික ලෙස පහල ගියේ සමහර විට කලක් තිස්සේ පැවති සේවක කලබලකාරිත්වය නිසා විය හැක. කෙසේ වෙතත්, 1969/70 වර්ෂයේ රෝල් නිෂ්පාදිත

සහ කම්බි නිෂ්පාදිත විකුණුමෙහි ඉහල යාමක් වාර්තා ගත වී ඇත. පිළිවෙලින් ටොන් 60,000 සහ 12,000 ක ධාරිතාව ඇති වානේ රෝල් ඇඹරුම් කම්හලත්, කම්බි කම්හලත් තම උපරිම ධාරිතාවයට බොහෝ අඩුවෙන් දිගින් දිගටම ක්‍රියාකර ඇත.

1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 2·6 ක ලාභයක් ඉපයූ සංස්ථාව ඉකුත්වූ වර්ෂයේ ද ලාභ එම මට්ටමම පවත්වා ගැනීමට සමත් වී ඇත. 1969/70 සඳහා වාණිජ කටයුතු වලින් ලත් ලාභ පිළිබඳ සංඛ්‍යා ලැබී නොමැති නමුත්, ඉකුත් වර්ෂයේ රුපියල් 230,000 ක අලාභයක් වාණිජ කටයුතු වලින් ලබා ඇත.

**8. සැදූ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ**

**(අ) ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව**

ඉකුත් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 36·2 ක්වූ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 38·0 දක්වා වැඩි වී ඇත. 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 5·0 ක් වූ නිෂ්පාදන වටිනාකම 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 3·6 දක්වා අඩු වී ඇත. නමුත් මෙම කාලසීමාව තුළ විකුණුම් වටිනාකම රුපියල් දශ ලක්ෂ 3·1 සිට රුපියල් දශ ලක්ෂ 4·9 දක්වා ඉහළ ගොස් ඇත. ඉකුත් වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 0·7 ක්වූ අලාභය හා සලකා බලන විට, 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 4·8 ක වාර්තාගත අලාභයක් ලබා ඇත.

1970 ජනවාරි/සැප්තැම්බර් කාලය තුළ සංස්ථාව මගින් උදළු 33,700 ක් නිපදවා ඇති අතර, 1969 මෙම කාලය තුළ නිපදවා ඇති උදළු ප්‍රමාණය 64,100 කි. නිෂ්පාදනය සීඝ්‍ර ලෙස පහල බැසීමට හේතු වූයේ කම්කරු නොසන්සුන්තාව වන අතර, වැඩ අතපසු වී උදළු නිෂ්පාදනය දිනකට 800 සිට 200 දක්වා පහල ගොස් ඇත. කෙසේ වෙතත්, 1970 වේ මැද භාගයේ පටන් සේවක අරගල විසඳී නිෂ්පාදනය දිනකට 1000 දක්වා වැඩි විය.

**9. ධීවර කර්මාන්තය**

**(අ) ලංකා ධීවර සංස්ථාව**

1969/70 වර්ෂයේ සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජන රුපියල් දශ ලක්ෂ 30·6 කින් නොහොත් 57% කින් වැඩි වී රුපියල් දශ ලක්ෂ 84·3 ක් විය. අල්ලන ලද මාළු ප්‍රමාණය 1968/69 වර්ෂයේ රාත්තල් දශ ලක්ෂ 9·9 සිට 1969/70 වර්ෂයේ 8·1 දක්වා පහල ගොස් ඇත. මුළු විකුණුම් 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8·8 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 13·2 දක්වා වැඩි විය· පසුගිය වර්ෂ කීපය තුලම සංස්ථාව මගින් විශාල වශයෙන් පාඩු ලබා ඇති අතර, 1969/70 වර්ෂයේ අලාභය තවම තක්සේරු කර නොමැත.

සංස්ථාව මගින් පොකිරිස්සන් ඇතුළු විවිධ වර්ගයේ මාළු මැලේසියාව, සිංගප්පූරුව, හොංකොන් සහ ජපානය වැනි රටවලට නිර්යාත කොට ඇත. 1968/69 වර්ෂයේ නිර්යාත කොට ඇති මුළු ප්‍රමාණය රාත්තල් 871,800 ක් වන අතර, රුපියල් 824,000 ක විදේශීය විනිමය උපයා ඇත. 1969/70 වර්ෂයේ නිර්යාත කළ ප්‍රමාණය රාත්තල් 775,700 ක් වන අතර, උපයා ගත් විදේශ විනිමය රුපියල් 731,400 කි.

## II (ඇ) 5 වැනි සංඛ්‍යා සටහන

## 1966/67 සිට 1970/71 දක්වා රාජ්‍ය ව්‍යවසායන්ගේ අපනයන

| සංස්ථාව | නිෂ්පාදන ඒකකය | 1966/67 | | 1967/68 | | 1968/69 | | 1969/70 | | 1970/71* | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමා-ණය | වටිනාකම රු. '000 | ප්‍රමා-ණය | වටිනාකම රු. '000 | ප්‍රමා-ණය | වටිනාකම රු. '000 | ප්‍රමා-ණය | වටිනාකම රු. '000 | ප්‍රමා-ණය | වටිනාකම රු. '000 |
| 1· ලංකා තෙල් සහ මේද .. | මේද අම්ල (ටොන් | — | — | 220·0 | 356·7 | 1285·0 | 2275·0 | 876·3 | 1588·3 | 487·9 | 869·5 |
| | ග්ලිසරින් (ටොන්) | — | — | 1·0 | 0·2 | 92·0 | 206·0 | 149·5 | 253·2 | 99·0 | 152·9 |
| 2· ලංකා සම්භාණ්ඩ .. | සපත්තු '000 යුගල | 2·0 | 44·5 | — | — | 20·0 | 784·3 | 3·5[1] | 33·3 | ල.නො | ල. නො. |
| | සම් '000 රාත්තල් | 5·9 | 9·8 | 11·5 | 13·5 | 8·0 | 21·1 | — | — | ල.නො | ල. නො. |
| 3· ලංකා ඛනිජ වැලි .. | ඉල්මනයිට් '000 ටොන් | 55·5 | 1453·2 | 73·4 | 2503·0 | 84·0 | 3150·0 | 81·5 | 4089·0 | 80·0 | 4297·7 |
| 4· පරන්තන් රසායන ද්‍රව්‍ය .. | ක්ලොරින් (ටොන්) | 13·3 | 15·4 | — | — | — | — | — | — | — | — |
| 5· ලංකා ටයර් .. | ටයර් (සංඛ්‍යාව) | — | — | — | — | 320 | | | | | |
| | ටියුබ් ( ,, ) | — | — | — | — | 320 | 38·6 | — | — | — | — |
| | පතු (සංඛ්‍යාව) | — | — | — | — | 120 | | | | | |
| 6· ලංකා ධීවර .. | මාළු '000 රාත්තල් | — | — | 986·6 | 648·1 | 826·5 | 672·3 | 744·1 | 631·7 | ල.නො | ල. නො. |
| | මෝරවරල් '000 රාත්තල් | 5·9 | 44·8 | 3·7 | 13·7 | 10·5 | 81·2 | 5·3 | 38·5 | ල.නො | ල. නො. |
| | වෙනත් නිෂ්පාදන ,, | — | — | 41·4 | 7·1 | 34·8 | 70·6 | 26·3 | 61·2 | ල.නො | ල. නො. |
| 7· ලංකා තුනී ලෑලි .. | පතුරු-හතරැස් අඩි | — | — | — | — | — | — | 9·2 | 66·2 | — | — |
| | තුනී ලෑලි-තහඩු(සංඛ්‍යාව) | — | — | — | — | — | — | ල.නො | 134·8 | ල.නො | 379·0[2] |
| 8· ලංකා පිඟන් භාණ්ඩ .. | පිරිසි කුට්ටම් – දුසිම් | — | — | — | — | — | — | 10,750 | 38 | — | — |

මූලය: සංඛ්‍යා ඒ ඒ සංස්ථා විසින් සපයන ලදී.

1· සෙරෙප්පු කුට්ටම් 3500. කි

2· මුල් මාස 6 සඳහා සත්‍ය සංඛ්‍යාය.

## 10. තැනීම්

### (අ) රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 26·6 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 33·3 දක්වා වැඩි විය.

1969/70 වර්ෂයේ සංස්ථාව මගින් රුපියල් දශ ලක්ෂ 59·7 ක් වටිනා කොන්ත්‍රාත් බාරගත් අතර, වර්ෂය අවසානයේ කළයුතුව තිබූ කොන්ත්‍රාත්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 161·9 ක් විය. 1969/70 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8·7 ක්වූ එහි ආදායම 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 8·1 ක් විය. කෙසේ වෙතත්, එහි ලාභය 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 2·7 සිට රුපියල් දශ ලක්ෂ 0·6 දක්වා 1969/70 වර්ෂයේ සියුම් ලෙස පහල ගොස් ඇත.

**සංඛ්‍යා සටහන II (ඇ) 6**

**ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව[1,2]**

| | ඒකකය | 1965/65 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 |
|---|---|---|---|---|---|---|
| 1· ආයෝජිත ප්‍රාග්ධනය[3] .. | රු. '000 | 3,270 | 19,655 | 29,330 | 26,588 | 33,299 |
| 2· වත්කම් අගය .. | රු. '000 | 56,620 | 79,100 | 95,250 | 30,646 | 38,732 |
| 3· නිමවුම .. | රු. '000 | | | | | |
| (අ) වර්ෂය තුල භාරගත් කොන්ත්‍රාත්තු වල අගය .. | | 22,900 | 140,200 | 46,685 | 95,346 | 59,703 |
| (ආ) වර්ෂය තුළ සැලසූ උපදේශක සහ වෙනත් සේවාවන්හි අගය .. | | 150 | 160 | 210 | 72 | — |
| (ඇ) වර්ෂය අගදී ඉතිරිව ඇති කොන්ත්‍රාත්වල අගය .. | | 61,449 | 179,500 | 198,500 | 96,077 | 161,855 |
| 4· ආදායම .. | රු. '000 | 24,376 | 20,540 | 36,108 | 8,118 | 8,701 |
| (අ) තැනීම් හා උපදෙස් .. | | 24,369 | 20,527 | 36,082 | 6,265 | 7,466 |
| (ආ) වෙනත් . | | 7 | 13 | 26 | 1,853 | 1,235 |
| 5· වියදම .. | රු. '000 | 20,372 | 26,600 | 32,000 | 5,425 | 5,621 |
| 6· ලාභය (+) හෝ පාඩුව (−)[4] .. | රු. '000 | −1,096† | −891† | −3,700† | +2,693 | +610 |
| 7· සේවා නියුක්තිය[5] .. | ගණන | 5,612 | 6,548 | 11,616 | 12,123 | 15,533 |
| (අ) ශ්‍රමය .. | | 4,998 | 5,444 | 10,116 | 10,927 | 13,610 |
| (ආ) වෙනත් .. | | 614 | 1,104 | 1,500 | 1,196 | 1,923 |

මූලය: ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

1· 1969/70 සඳහා වූ සංඛ්‍යා තාවකාලිකය.

2· අප්‍රේල් – මාර්තු ගිණුම් වර්ෂයන් සඳහාය.

3· වර්ෂාවසානයේ සමුච්චිතය.

4· බදු අය කිරීමට පෙර

5· වර්ෂාවසානයට.

† සංශෝධිත සංඛ්‍යා ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව පදනම් කරගෙන ඇත.

### සංඛ්‍යා සටහන II (ඈ) 7
### රාජ්‍ය වැවිලි සංස්ථාව[1]

| ශීර්ෂය | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 |
|---|---|---|---|---|---|
| 1· ආයෝජිත ප්‍රාග්ධනය[2] (රු. '000) .. | 33,542 | 39,185 | 32,000 | 36,257 | 38,713 |
| (අ) වැවිලි .. | 28,378 | 34,000 | 25,000 | 29,238 | 31,683 |
| (ආ) කර්මාන්තශාලා .. | 5,164 | 5,185 | 7,000 | 7,029 | 7,030 |
| 2· වැවිලි | | | | | |
| (අ) සංඛ්‍යාව .. | 12 | 12 | 15 | 15 | 14 |
| (ආ) අක්කර .. | 8,654 | 8,654 | 14,734 | 14,249 | 13,691 |
| (ඇ) වගා කළ අක්කර ගණන .. | 5,565 | 5,513 | 6,719 | 9,698 | 9,978 |
| (ඈ) ආදයම (රු. '000) .. | 1,841 | 3,193 | 5,184 | 4,744 | 4,596 |
| (ඉ) ලාභය (+) හෝ පාඩුව (−) (රු. '000)[3] .. | + 111 | — 350 | + 725 | + 11 | — 16 |
| (ඊ) සේවා නියුක්තිය (ගණන) .. | 6,631 | 6,441 | 8,594 | 7,389 | 6,601 |
| 3· කර්මාන්ත ශාලා | | | | | |
| (අ) සංඛ්‍යාව .. | 3 | 3 | 4 | 4 | 4 |
| (ආ) ආදයම (රු. '000) .. | 2,107 | 1,458 | 1,125 | 4,175 | 3,080 |
| (ඇ) ලාභය (+) හෝ පාඩුව (−) (රු. '000)[3] .. | — 33 | — 134 | — 77 | — 109 | — 145 |
| (ඈ) සේවා නියුක්තිය (ගණන) .. | 215 | 192 | 356 | 351 | 262 |
| 4· සංස්ථා එකතුව | | | | | |
| (අ) මුළු ආදයම (රු. '000) .. | 3,948 | 4,651 | 6,309 | 8,919 | 7,677 |
| (ආ) ලාභය (+) හෝ පාඩුව (−) (රු. '000) .. | + 86† | + 16† | + 295† | — 97 | — 161 |
| (ඇ) සේවා නියුක්තිය (ගණන) .. | 6,846 | 6,633 | 8,950 | 7,740 | 6,863 |

මූලය: රාජ්‍ය වැවිලි සංස්ථාව

1· ගිණුම් වර්ෂය ඔක්තෝබර් සිට සැප්තැම්බර් දක්වා වේ. 1969/70 සංඛ්‍යා තාවකාලිකය.
2· ගිණුම් වර්ෂාවසානයට සමුච්චිතය.
3· බදු අය කිරීමට පෙර
† සංශෝධිත සංඛ්‍යා ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව පදනම් කරගෙන ඇත.

## (ආ) කෘෂිකාර්මික අංශය.

### (අ) ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

1968/69 තුල රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් වතු 15 ක්හා කම්හල් 4 ක් පාලනය කරන ලදී. සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජනය 1965/66 වර්ෂයේ රුපියල් දශලක්ෂ 33·5 සිට රුපියල් දශලක්ෂ 39·2 දක්වා, 1966/67 වර්ෂ වනවිට වැඩිවී ඇත. 1967/68 වර්ෂයේ එය රුපියල් දශලක්ෂ 32·0 දක්වා පහල වැටුන අතර, 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 36·3 දක්වා ඉහළ ගියේය. 1969/70 වර්ෂයේ ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 38·7 ක්ව තිබූ අතර, මින් රුපියල් දශලක්ෂ 31·7 ක් වගාවන් සඳහාද, රුපියල් 7,030,000 ක් කම්හල් සඳහාද විය.

සංස්ථාවේ රබර්, පොල් සහ කොකෝ වතුවලින් ලාභ ලැබූ අතර, මෙයට තරමක් දුරට හේතු වූයේ මෙම නිෂ්පාදිවනල මිල සතුටුදයක මට්ටමක පැවතීමයි. සංස්ථාවේ තේ වතුවලින් ලැබූ ප්‍රතිඵල සාමාන්‍යයෙන් අසතුටුදයක වූ අතර, මිල පහල යාම මෙයට තරමක් දුරට හේතු විය. පැලවත්ත වගාවෙන් රුපියල් 1,27,782 ක අලාභයක් ලැබීය. මෙයට හේතු වූයේ කම්හලේ යන්ත්‍ර තුනෙන් දෙකක් මාස නවයක කාල සීමාවක් ක්‍රියාවිරහිතව තිබීම, සේවකයන්ගේ හිඟය, අඩු ඵලදාව සහ තේ මිල අඩුවීමයි. යහලතැන්න/දිප්පිටිය වතු ගොවීන්ට බෙදදීම සඳහා රජයට භාරදෙන තුරු සංස්ථාව මගින් පාලනය කරන ලදී.

## (ඇ) සේවා අංශය

පොදු ව්‍යාවසායයන්හි සේවා අංශයෙහි සංස්ථා, මණ්ඩල සහ රජයේ දෙපාර්ත-මේන්තු කිහිපයක් ඇතුළත්වේ. මෙම සංස්ථාවල සහ ලංකා රජයේ දුම්රිය සේවයේ (රජයේ වෙනත් දෙපාර්තමේන්තු හැර) මුළු ආයෝජන ප්‍රමාණය 1968/69 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 2634·2 ක්වූ අතර, 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 283·00 ක් වූයේ සියයට 7·4 ක වැඩිවීමක් පෙන්නුම් කරමිනි. මුළු සේවා නියුක්තිය 144,336 සිට 1969/70 වර්ෂයේ 150,645 දක්වා වැඩිවී ඇත.

1969/70 මෙම අංශයේ මුළු වියදම රුපියල් දශලක්ෂ 1731·0 ක් වූ අතර, 1968/69 වර්ෂයේ එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1615·6 ක් විය.

## 1. විදුලි බලය, ගෑස් සහ ජලය

### (අ) ලංකා විදුලි බල මණ්ඩලය

ලංකා විදුලි බල මණ්ඩලය 1969 නොවැම්බර් මස 1 වන දින පිහිටුවන ලද අතර 1970 වර්ෂය එහි ප්‍රථම ක්‍රියාකාරී පූර්ණ වර්ෂය වේ, මණ්ඩලයේ මුදල් වර්ෂය අවසන් වන්නේ 1970.12.31 වුවත්, සංඛ්‍යා ලබා ගත හැකිව ඇත්තේ 1969 නොවැම්බර් 1 වන දින සිට 1970 ඔක්තෝබර් 31 වන දින දක්වා කාලය සඳහා පමණි.

**II (ඇ) 8 සංඛ්‍යා සටහන**

| | ඒකකය | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70 |
|---|---|---|---|---|---|---|
| 1· ලංකා විදුලි බල මණ්ඩලය[1] | | | | | | |
| 1· ආයෝජිත ප්‍රාග්ධනය[2] .. | රු· '000 | 525,600 | 579,400 | 649,800 | 741,900 | 784,000 |
| 2· ධාරිතාව | කි· වො· දශ ලක්ෂ | | | | | |
| (අ) සවිකළ ධාරිතාව .. | | **195·0** | **181·0** | **181·0** | **262·0** | **262·0** |
| (i) ජල විදුලි බලය .. | | 110·0 | 111·0 | 111·0 | 192·0 | 192·0 |
| (ii) තාප බලය .. | | 85·0 | 70·0 | 70·0 | 70·0 | 70·0 |
| (ආ) සපල ධාරිතාව .. | | **154·0** | **154·3** | **168·5** | **222 5** | ල. නො. |
| 3· උත්පාදිත සහ විකුණූ බලය | කි· වො· දශ ලක්ෂ | | | | | |
| (අ) උත්පාදිත ඒකක .. | | 477·6 | 560·8 | 594·4 | 708·3 | 772·0 |
| (ආ) පවතින ඒකක[3] .. | | 468·9 | 547·3 | 581·4 | 696·1 | 767·0 |
| (ඇ) සම්ප්‍රේෂණයේදී අපතේ ගිය ඒකක යනාදිය .. | | 61·4 | 75·5 | 70·4 | 122·3 | 119·0 |
| (ඈ) විකුණූ ඒකක .. | | 407·5 | 471·7 | 511·0 | 573·0 | 648·0 |
| 4· විදුලිය අලෙවිය .. | කි· වො· දශ ලක්ෂ | **407·5** | **471·8** | **511·1** | **573·7** | **648·0** |
| (අ) දේශීය .. | | 45·2 | 27·9 | 53·2 | 57·0 | 60·0 |
| (ආ) වෙළඳ .. | | 67·5 | 71·8 | 77·8 | 77·6 | 85·0 |
| (ඇ) කාර්මික .. | | 162·4 | 224·5 | 250·5 | 284·9 | 329·0 |
| (ඈ) ප්‍රාදේශීය බල මණ්ඩල .. | | 106·9 | 123·1 | 121·8 | 143·9 | 161·0 |
| (ඉ) අනිකුත්[4] .. | | 25·5 | 4·5 | 7·8 | 10·3 | 13·0 |
| 5· මුළු අයභාරය .. | රු· '000 | **58,300** | **64,900** | **73,200** | **81,800** | **95,940** |
| (අ) විදුලි අලෙවිය .. | | 53,700 | 61,600 | 69,800 | 76,000 | 92,700 |
| (ආ) අනෙකුත් .. | | 4,600 | 3,300 | 3,400 | 5,800 | 3,240 |
| 6· යන්ත්‍ර උපයෝගීකර ගැනීමේ සාධකය[5] .. | සියයට | 28·1 | 35·3 | 39·4 | 30·3 | 33·7 |
| 7· මුළු වියදම .. | රු· '000 | **44,300** | **53,100** | **64,100** | **72,200** | ල. නො. |
| (අ) උත්පාදනය .. | | 4,700 | 6,400 | 10,300 | 12,200 | ල. නො. |
| (ආ) සම්ප්‍රේෂණය .. | | 2,700 | 3,000 | 3,300 | 3,900 | ල. නො. |
| (ඇ) බෙදා හැරීම .. | | 3,200 | 3,400 | 3,500 | 4,600 | ල. නො. |
| (ඈ) පොදු වියදම්[6] .. | | 6,300 | 6,800 | 8,500 | 10,900 | ල නො. |
| (ඉ) පොළී සහ ගෙවුම් .. | | 27,400 | 33,500 | 38,500 | 40,800 | ල. නො. |
| 8· ලාභ(+) හෝ පාඩු (−)[7] .. | රු· '000 | +7,565† | +8,954† | +8,548† | +9,200 | ල. නො. |
| 9· සේවා නියුක්තිය[8] .. | ගණන | 5,630 | 5,690 | 5,869 | 5,871 | 7,650 |

මූලය: ලංකා විදුලි බල මණ්ඩලය

1. ඔක්තෝම්බර් – සැප්තැම්බර් ගිණුම් වර්ෂ සඳහාය. 1969/70 වර්ෂය සඳහා සංඛ්‍යා තාවකාලිකය.
2· වර්ෂාවසානයේ සමුච්චිතය 3· මධ්‍යස්ථානවල නිපයූ ඒකක අඩුකොට උත්පාදිත ඒකක
4· ගල්ඔය සංවර්ධන මණ්ඩලය, පොදු කාර්‍ය සඳහා ආලෝක කිරීම යනාදිය ඇතුලත්ය.
5· යන්ත්‍ර උපයෝගීකරණයේ සාමාන්‍ය අනුපාතය.
6· ප්‍රධාන කාර්‍යාලය යනාදිය 7· බද්ද අයකිරීමට පෙර 8· වර්ෂාවසානය දක්වා.

ප්‍රාග්ධන ආයෝජන 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 741·9 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 784·0 දක්වා වැඩිවිය. රුපියල් දශලක්ෂ 64·1 ක්වූ 1967/68 වර්ෂයේ මුළු වියදම 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 72·2 ක් වූ අතර, රුපියල් දශලක්ෂ 73·2 ක් වූ 167·68 මුළු ආදායම 1968/69 වර්ෂයේ රුපියල් දශලක්ෂ 81·8 ක් විය. 1967/68 වර්ෂයේ ලබාගත් රුපියල් දශලක්ෂ 8·5 ක ලාභය 1968/69 වර්ෂයේ මණ්ඩලය මගින් රුපියල් දශලක්ෂ 9·2 දක්වා වැඩිකරගෙන ඇත.

**(ආ) ජල සම්පත් මණ්ඩලය**

ක්‍රම සම්පාදන සහ රැකීරක්ෂා අමාත්‍යංශය යටතේ ඇති උපදේශක ආයතනයක් ලෙස කටයුතු කරන ජල සම්පත් මණ්ඩලය පිළිබඳ මූලික සංඛ්‍යා සමහරක් II (ඇ) 9 සංඛ්‍යා සටහනින් දැක්වේ.

**II (ඇ) 9 වැනි සංඛ්‍යා සටහන**

| ජල සම්පත් මණ්ඩලය(අ) | | 1966–67 | 1967–68 | 1968–69 | 1969–70 | 1970–71 |
|---|---|---|---|---|---|---|
| 1· ප්‍රාග්ධන ලැබීම්(ආ) | (රු. '000) | 245 | 76 | 300 | 300 | 300 |
| 2· ආදායම | ( ,, ) | 245 | 76 | 335 | 370 | 370 |
| 3· වියදම | ( ,, ) | 165 | 240 | 274 | 370 | 370 |
| 4· අතිරික්තය (+) හෝ හිඟය (−) (ඇ) | ( ,, ) | +135 | −165 | +64 | — | – |
| 5· සේවා නියුක්තිය (ඈ) (ගණන) | | 15 | 20 | 28 | 28 | 28 |

මූලයː ජල සම්පත් මණ්ඩලය.

(අ) ඔක්තෝබර්-සැප්තැම්බර් ගිණුම් වර්ෂය සඳහාය. 1969/70 ට පසු සංඛ්‍යා තාවකාලිකය.

(ආ) දීමනා ලෙස.

(ඇ) වියදම අඩු කළ පසු ආදායම.

(ඈ) වර්ෂය අවසානය සඳහා.

**2. ගමනාගමනය, ගබඩා කිරීම සහ සන්නිවේදන හුවමාරු**

**(අ) ලංකා දුම්රිය සේවය**

1968/69 මුදල් වර්ෂය අවසානයේ තිබූ රුපියල් දශලක්ෂ 665·7 ක් වූ මුළු ආයෝජන ප්‍රමාණය 1969/70 වර්ෂ අවසානයේදී රුපියල් දශලක්ෂ 30 කින් පමණ වැඩිවී රුපියල් දශලක්ෂ 696 ක් පමණ වේ යයි ඇස්තමේන්තු කොට ඇත.

ඉකුත් වර්ෂයේ වැඩිවීමවූ දශලක්ෂ 4 හා සසඳන කළ 1969/70 වර්ෂයේ ගෙන යන ලද මගීන් ප්‍රමාණය දශලක්ෂ 1·5 කින් පමණ වැඩිවේ යයි ඇස්තමේන්තු කොට ඇත. 1969/70 වර්ෂයේ මගී සැතපුම් ගණන 1968/69 වර්ෂයට වඩා සීඝ්‍ර වැඩිවීමක් පෙන්වන අතර, මගී ලැබීම් රුපියල් දශලක්ෂ 57 සිට 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 60·5 දක්වා වැඩිවීම පසුගිය වර්ෂයට වඩා අඩුවීමක් පෙන්වයි.

මහාමාර්ග ගමනාගමනයේ තරගය නොසලකා ප්‍රවාහණය කරන ලද භාණ්ඩ ප්‍රමාණය ටොන් දශලක්ෂ 0·2 ක ආන්තික වැඩිවීමක් පෙන්වයි. භාණ්ඩ ප්‍රවාහන සැතපුම් ගණන ටොන් දශලක්ෂ 5 ක වැඩිවීමක් පෙනවන අතර පසුගිය වර්ෂයේ එම ප්‍රමාණය ටොන් දශලක්ෂ 1·5 ක අඩුවීමක් පෙන්විය. භාණ්ඩ ප්‍රවාහණය කිරීමෙන් ලැබූ මුළු ආදායමෙහිද වැඩිවීමක් වාර්තාගතවී ඇත.

දුම්රිය සේවයේ ඇස්තමේන්තු කළ මුළු ආදායමෙහි රුපියල් දශලක්ෂ 7·4 ක වැඩිවීම පසුගිය වර්ෂයට වඩා වැඩි අතර මුළු වියදමද රුපියල් දශලක්ෂ 5 කින් වැඩිවී ඇත. මුළු ආදායමෙහි වැඩිවීම නිසා දුම්රිය සේවයට එහි සමස්ථ අලාභය රුපියල් දශලක්ෂ 2·3 කින් රුපියල් දශලක්ෂ 55·1 දක්වා අඩුකර ගැනීමට හැකිවී ඇත. දුම්රිය

සේවයේ සමස්ථ අලාභය 1965/66 වර්ෂයේ දශලක්ෂ 50·3 සිට 1966/67 වර්ෂයේ 46·2 දක්වා උච්ඡාවචනයවූ අතර 1968/69 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 57·4 ක ඉහළම මට්ටමට පැමිණ ඇත.

**(ආ) ලංකා ගමනාගමන මණ්ඩලය**

1969/70 න් අවසන් වන වර්ෂ හතරේ සහ 1970/71 වර්ෂය සඳහා ඇස්තමේන්තු කොට ඇති මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වැදගත් සංඛ්‍යා සමහරක් II (ඇ) 10 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

මණ්ඩලයේ මුළු ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය 1969/70 රුපියල් දශලක්ෂ 48 කින් රුපියල් දශලක්ෂ 315·4 දක්වා වැඩිවූ අතර මින් රුපියල් දශලක්ෂ 251·8 ක්, රථවාහන සඳහා වූ අතර ඉතිරි රුපියල් දශලක්ෂ 63·6 ප්‍රමාණය රථ අළුත්වැඩියා කරන ස්ථාන, බස් ඩිපෝ සහ මගී ආවරණ ස්ථාන ආදිය සඳහා විය.

මණ්ඩලයට අයත්ව තිබූ වාහන සංඛ්‍යාව 445 කින් වැඩිවී 1969/70 වර්ෂයේ 6326 ක් විය. මින් ධාවනය වන බස් තොගය 1066 කින්ද, ධාවනය සඳහා යෙදවිය හැකි තොගය 599 කින්ද වැඩිවී ඇත.

ධාවනය සඳහා සටහන් කළ සැතපුම් ගණන 1969/70 වර්ෂයේ සැතපුම් දශලක්ෂ 19·6 කින් වැඩිවිය. අනික් අතට ක්‍රියාත්මකවූ සැතපුම් ගණන සැතපුම් දශලක්ෂ 16·4 කින් වැඩිවිය. රථ ආපදාවීම හා නියමිත වේලාවට පදවන්නන් නොමැතිවීම ආදිය නිසා අපතේ ගිය සැතපුම් ගණන සැතපුම් දශලක්ෂ 10·3 කින් සැතපුම් දශලක්ෂ 42·8 දක්වා වැඩිවිය. බස් පටන්ගන්නා ස්ථානවලට ගරාජයේ සිට හිස්ව ගමන්කිරීම ආදිය නිසා අපතේ ගිය සැතපුම් ගණන 1968/69 සැතපුම් දශලක්ෂ 1·9 සිට 1969/70 වර්ෂයේ සැතපුම් දශලක්ෂ 1·5 දක්වා අඩුවී ඇත.

පසුගිය වර්ෂවල නොකඩවා වැඩිවෙමින් පවත්වා ගෙන යන ලද මුළු මගීන් සංඛ්‍යාව 1969/70 වර්ෂයේ දශලක්ෂ 1356·7 දක්වා වැඩිවී ඇත. මුළු ආසන සැතපුම් ගණන 1969/70 වර්ෂයේ දශලක්ෂ 690·2 කින් වැඩිවූ අතර මුළු මගී සැතපුම් ගණන දශලක්ෂ 237·9 කින් වැඩිවිය. මෙහි ප්‍රතිඵලය වූයේ පැටවුම් සාධකය (මුළු ආසන සැතපුම් ධාරිතාවට මගී සැතපුම් අනුපාතය) 1968/69 වර්ෂයේ සියයට 61·5 සිට 1969/70 සියයට 60 දක්වා සියුම් ලෙස පහළ යාමය. 1966/67 සිට 1968/69 දක්වා සම මට්ටමක ස්ථාවරව තිබූ බස් රථයක් දිනකට ගමන් කළ සැතපුම් ගණන පෙන්වන, රථයක සාමාන්‍ය උපයෝගීකරණය දිනකට සැතපුම් 157 සිට 1969/70 වර්ෂයේ 154 දක්වා අඩුවී ඇත.

පසුගිය වර්ෂවල මණ්ඩලයේ සේවා නියුක්තිය සීඝ්‍ර ලෙස වැඩිවෙමින් පැවතිණි. 1966/67 වර්ෂයේ ශ්‍රමිකයන් සංඛ්‍යාව 32165 ක්වූ අතර 1968/69 එය 40097 ක් විය. 1969/70 වර්ෂයේ සේවා නියුක්තිය 1328 කින් 41425 දක්වා වැඩිවිය. සේවා නියුක්තියේ වැඩිවීම ධාවනය කළ බස් රථවල වැඩීමට වඩා වැඩිය. 1966/67 වර්ෂයේ ධාවනය වූ බස් අතුරින් බස් රථයක් සඳහා සිටි සාමාන්‍ය සේවක සංඛ්‍යාව 8·2 ක්වූ අතර 1969/70 වර්ෂයේ එය 9·0 ක් විය.

1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 8·3 කින් වැඩිවූ මණ්ඩලයේ ආදායම රුපියල් දශලක්ෂ 287·8 ක්වූ අතර රුපියල් දශලක්ෂ 29·9 කින් වැඩිවූ වියදම රුපියල් දශලක්ෂ 322·1 ක් විය. වැඩිවූ ආදායම විශාල ලෙස වැඩිවූ වියදම මගින් පියවී ගිය අතර, ප්‍රතිඵලය ලෙස ක්‍රියාකාරිවීමෙන් එම වර්ෂයේ ලැබූ අලාභය රුපියල් දශලක්ෂ 34·2 ක් විය. මේ අතර 1967/68 සහ 1968/69 වර්ෂවල ලැබූ අලාභ පිළිවෙලින් රුපියල් දශලක්ෂ 7·2 ක් සහ 13·2 ක් විය.

**(ඇ) ලංකා ගුවන් සේවය**

1968/69 වර්ෂයේදී රුපියල් 31,960,000 දක්වා වැඩිවූ වත්කම්වල වටිනාකම 1969/70 වර්ෂයේදී රුපියල් 29,745,000 දක්වා පහළ බැස ඇත.

1968/69 වර්ෂයේ ලංකා ගුවන් සේවය මගින් ගෙන යන ලද මගීන් සංඛ්‍යාව 2,214 කින්ද, ප්‍රවාහණය කරන ලද භාණ්ඩ ප්‍රමාණය ටොන් 27 කින්ද, මගී සැතපුම් ගණන 958 කින්ද අඩුවිය. අභ්‍යන්තරික සේවාවල පැටවුම් සාධකය ඉහළ යාමක් පෙන්වන අතර, 1968/69 වර්ෂයේ මුළු ආදායම බලන විට ලාභ ලැබීමට බලාපොරොත්තු-විය. නමුත් ඇස්තමේන්තු අනුව 1968/69 වර්ෂයේ වියදම් වැඩිවී ඇති අතර, අවසාන ප්‍රතිඵලය වනුයේ ලාභය අඩුවීමයි. 1969/70 වර්ෂය තුළ ජාත්‍යන්තර මෙන්ම අභ්‍යන්තර සේවා වලද සංඛ්‍යාතය සැලකිය යුතු වැඩිවීමක් තිබූ අතර, එබැවින් මගීන් සහ ගෙන ගිය බඩු ප්‍රමාණයෙහි ඇස්තමේන්තු ගත වැඩිවීමක් විය. කෙසේ වෙතත් මෙම වැඩිවීම සංඛ්‍යාතය වැඩිවීම නිසා ඇතිවූ අමතර ධාරිතා ප්‍රමාණයේ වැඩිවීමට සමානුපාත වූයේ නැත.

1968/69 වර්ෂයේ මුළු ආදායමවූ රුපියල් 10,565,000 ප්‍රමාණය 1969/70 වර්ෂයේ ඇස්තමේන්තු අනුව රුපියල් 19,761,000 දක්වා වැඩිවීමක් පෙන්නුම් කරයි. ගුවන් යානා අමතර කොටස් ආයාත සඳහා වි. වි. හි. ස ගෙවීම්, පවත්වාගෙන යාමේ සහ වෙනත් ක්‍රියාකාරි වැඩිවීම, 1969 සැප්තැම්බර් මස ට්‍රයිඩෙන්ට් ජෙට් ගුවන් යානය හඳුන්වා දීම සහ වැටුප් බිලෙහි වැඩිවීම යන කරුණු නිසා මුළු වියදමෙහි රුපියල් 15,484,000 ක සැලකිය යුතු වැඩිවීමක් දක්වයි. ආදායමෙහි ඉහළ යාම වියදමෙහි සීඝ්‍ර වැඩීම නිසා, පියවෙන අතර, ප්‍රතිඵල ලෙස 1968/69 වර්ෂයේ අලාභය වූ රුපියල් 742,000 හා සසඳන කළ 1969/70 වර්ෂයේ රුපියල් දශලක්ෂ 5 5 ක අලාභයක් ලබා ඇත.

**(ඇ) කොළඹ වරාය කොමිෂන් සභාව**

1955 වත්කම්වල කරන ලද අගැයීමක් අනුව වරාය කොමිෂන් සභාවේ 1970 සැප්තැම්බර් 30 වන දිනට ඇස්තමේන්තු කළ ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 326·8 ක් විය. මෙම වර්ෂයේ සංවර්ධන වැඩ කටයුතු සමග එම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 348·8 දක්වා වැඩි වේයයි බලාපොරොත්තු වෙයි. මෙම ආයෝජනවලින් සෑහෙන කොටසක් කොළඹ වරාය සඳහා වෙයි. 1966/67 වර්ෂයේ සියුම් ලෙස පහළ ගිය ආදායම 1967/68 වර්ෂයේ රුපියල් දශලක්ෂ 33·8 සිට රුපියල් දශලක්ෂ 36·3 දක්වා වැඩිවූ අතර, 1968/69 සහ 1969/70 වර්ෂවලද නොකඩවා වැඩිවන උපනතියක් දක්වූයේ රුපියල් දශලක්ෂ 44·3 ක් වෙමිනි.

1969/70 වර්ෂයේද ඉහළ යාමක් පෙන්වූ ක්‍රියාකාරී වියදම් වි. වි. හි. ස. ක්‍රමය සහ රුපියලේ අගය අවප්‍රමාණ කිරීමෙන් ද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා පවත්වා ගෙන යාමේ වියදම් ඉහළ යාමෙන්ද, ඒකාබද්ධ වේතන ක්‍රම නිසා සේවකයන්ට අතිකාල දීමනා සහ වැටුප් වැඩිපුර ගෙවීමෙන්ද, වරාය සේවකයන්ට නොමිලේ දෙන ආහාර සඳහා වියදම ඉහළ යාමෙන්ද 1970/71 වර්ෂයේ මෙම වියදම් තවදුරටත් වැඩිවීමක් බලාපොරොත්තු වෙයි.

1969/70 වර්ෂයේ ආදායමෙහි වැඩිවීම ක්‍රියාකාරි වියදම් විශාල ලෙස වැඩිවීම නිසා පියවී ගිය අතර ප්‍රතිඵලයක් ලෙස සමස්ථ අලාභය රුපියල් දශලක්ෂ 4·4 ක් වූයේ 1968/69 වර්ෂයේ මෙම ප්‍රමාණය රුපියල් දශලක්ෂ 6·6 ක් විය. කෙසේ වෙතත් කොළඹ වරාය ගැන බලන විට 1969/70 වර්ෂයේ ආදායම මගින් ක්‍රියාකාරි වියදම ඉක්මවා ඇත.

**(ඉ) වරාය (නැව්බඩු) සංස්ථාව**

පසුගිය වර්ෂ 5 තුළ (අගෝස්තු/ජූලි) සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වැදගත් කරුණු සමහරක් II (ඇ) 10 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1970 ජූලි අවසානයට සංස්ථාවේ ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 66·2 ක් වූයේ පසුගිය වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 2 ක පමණ වැඩිවීමක් පෙන්වමිනි. මෙම වැඩිවීම ත්‍රිකුණාමල වරාය සඳහාය. 1968/69 වර්ෂයේ සංස්ථාව විසින් එහා මෙහා කරන ලද බඩු ප්‍රමාණය ටොන් 346,000 කින් වැඩිවී ටොන් දශලක්ෂ 3·5 ක්වූ අතර 1969/70 වර්ෂයේ එහි ආන්තික අඩුවීමක් විය. 1969/70 වර්ෂයේ කොළඹ සහ

| ලංකාණ්ඩුවේ දුම්රිය[1] | 1965/66 | 1966/67 | 1967/68 | 1968/69 | 1969/70* |
|---|---|---|---|---|---|
| 1· ආයෝජිත ප්‍රාග්ධනය[2] (රු. '000) .. .. | 592,900 | 614,300 | 639,132 | 665,679 | 696,000 |
| 2· ධාවන පථය (සැතපුම් ගණන) .. .. | 1,043 | 1,053 | 1,053 | 1,076 | 1,076 |
| 3· රිය (සංඛ්‍යාව) .. .. | 8,204 | 8,067 | 7,353 | 7,484 | 7,484 |
| (අ) දුම්රිය ඇන්ජින් .. .. | 357 | 355 | 344 | 393 | 393 |
| (ආ) දුම්රිය මැදිරි .. .. | 7,847 | 7,712 | 7,009 | 7,091 | 7,091 |
| 4· ගෙන ගිය | | | | | |
| (අ) මගීන් (දශ ලක්ෂ)[4] .. .. | 74·7 | 78 7 | 81·5 | 85·5 | 87·0 |
| (ආ) භාණ්ඩ (ටොන් දශ ලක්ෂ)[5] .. .. | 1·7 | 1·8 | 1·8 | 1·8 | 2·0 |
| 5· ධාවන සැතපුම් ගණන | | | | | |
| (අ) මගීන් ගණන (මගීන් දශ ලක්ෂ සැ. ගණන) .. | 1536·9 | 1584·9 | 1678·3 | 1781·2 | 1900·0 |
| (ආ) භාණ්ඩ ප්‍රවාහන සැ. ගණන (ටොන් සැ. දශලක්ෂ) | 212·1 | 211·9 | 221·5 | 220·0 | 225·0 |
| 6· මුළු ආදයම (රු '000) .. .. | 99,900 | 102,100 | 108,769 | 109,680 | 117,041 |
| (අ) මගීන් .. .. | 48,900 | 50,600 | 53,944 | 57,031 | 60,526 |
| (ආ) භාණ්ඩ .. .. | 43,700 | 43,300 | 44,154 | 43,913 | 46,337 |
| (ඇ) වෙනත් .. .. | 7,400 | 8,200 | 8,671 | 8,736 | 10,178 |
| 7· මුළු වියදම[6] (රු. '000) .. .. | 150,200 | 148,300 | 168,444 | 167,118 | 172,164 |
